LANKA COAL COMPANY(PVT)LTD

LANKA COAL COMPANY (PVT) LTD.

Subsidiary Company of Ceylon Electricity Board



ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම

லங்காகோல் நிறுவனம் (பிரைவேட்) லிமிடெட்

Lanka Coal Company (Pvt) Ltd.

වාර්ෂික වාර්තාව

ஆண்ட றிக்கை

Annual Report 2017

සංස්ථාපනය කිරීම

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම අමාත්‍ය මණ්ඩලය විසින් 2006 වර්ෂයේදී ගනු ලැබූ තීරණයක් මත 2008 වර්ෂයේදී පිහිටුවනු ලැබූ අතර 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලදි.

දැක්ම

ශ්‍රී ලංකාව තුළ නිරන්තරයෙන් බලශක්තිය සැපයීමට වගබලාගනු පිණිස ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති ගල් අඟුරු දාහක තාපජනක බලාගාර සඳහා අවශ්‍ය ගල් අඟුරු නියමිත තත්ත්වයෙන් සහ ප්‍රමාණයෙන්, කාර්යක්ෂමව සහ ක්‍රියාශීලීව අවම පිරිවැයකින් ප්‍රසම්පාදනය කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති ගල් අඟුරු දාහක තාපජනක බලාගාර සඳහා අවශ්‍ය ගල් අඟුරු නියමිත ප්‍රමාණයෙන් සාධාරණ මිළකට ප්‍රසම්පාදනය කිරීම. ගල් අඟුරු අළු භාවිතා කොට නව නිෂ්පාදන හඳුන්වා දෙමින් පරිසර හිතකාමී ගල් අඟුරු කසල කළමනාකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම. කර්මාන්තකරුවන්ගේ ආර්ථිකය මෙන්ම රටේ ආර්ථිකය ද වඩාත් ශක්තිමත් කිරීමේ විකල්ප බලශක්ති මූලාශ්‍රයක් ලෙස ඔවුන්ට ගල් අඟුරු හඳුන්වාදීම.

පටුන

සංස්ථාපිත තොරතුරු	4
සභාපතිතුමාගේ පණිවිඩය	5
කාර්යසාධන සමාලෝචනය	6 - 9
අවදානම් කළමනාකරණය	10 - 11
අනාගත උපායමාර්ගික සැලසුම්	12 - 13
අධ්‍යක්ෂ මණ්ඩලය	14
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව	15 - 17
පාලනය	18
විගණකාධිපතිගේ වාර්තාව	19 - 21
2017 වර්ෂයට අදාල විගණකාධිපතිගේ වාර්තාව සඳහා ලංකා ගල් අඟුරු සමාගමේ නිරීක්ෂණ	22 -23
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	24
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ අනිකුත් විස්තීර්ණ ආදායම්	25
ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශනය	26
මුදල් ගැලීමේ ප්‍රකාශය	27
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	28 - 44

සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම	සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම
සමාගම ලියාපදිංචි කිරීමේ අංකය	පීවී 62636
නෛතික සැකැස්ම	2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සීමිත වගකීම් සහිත පුද්ගලික සමාගමකි. අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් මගින් ස්ථාපනය කරන ලද පූර්ණ වශයෙන් රජය සතු ව්‍යාපාර කළමනාකරණය කරනු ලබන සමාගමකි.
ලියාපදිංචි කාර්යාලය	අංක 51/3, සුරනිමල පෙදෙස, දුටුගැමුණු වීදිය, කොහුවල, දෙහිවල, ශ්‍රී ලංකාව. දු.ක. +94 11 2824681/2 ෆැක්ස් +94 11 2824689 විද්‍යුත් තැපෑල consec@lankacoal.lk වෙබ් අඩවිය www.lankacoal.lk
පරිපාලන සමාගම	ලංකා විදුලිබල මණ්ඩලය අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
සම්ගම් ලේකම්වරු	සීමාසහිත පී.ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්ගලික) සමාගම අංක 3/17, කිංසි පාර, කොළඹ 08.
විගණකවරු	විගණකාධිපති ජාතික විගණන කාර්යාලය, 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.
බැංකුකරුවෝ	මහජන බැංකුව - ආයතනික ශාඛාව ලංකා බැංකුව - අධිශ්‍රේණි ශාඛාව - හයිඩ් පාර්ක්

සභාපති / කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය

2017 වර්ෂය අවසානයේ සමාගමේ වාර්ෂික වාර්තාව මවිසින් ඉදිරිපත් කිරීම පිළිබඳව මම ඉමහත් සතුටට පත් වෙමි. මා මෙම තනතුරට පත්වූයේ 2017 වර්ෂයේදී වන අතර, එදා සිට සමාගම කාර්යක්ෂම සහ ඵලදායී මූලාශ්‍රයන්හි බොහෝ අංශයන් තුළින්, යහ පාලනයක් පිහිටුවමින් සහ පරිපාලන කටයුතු වඩා ශක්තිමත් කරමින් පරිවර්තනයකට ලක්ව ඇත. මෙකී කරුණුවලින් වැඩි ගණනක් ඉටුකර ගැනීමට හැකිවී ඇත්තේ වෘත්තීයමය කාර්යමණ්ඩලයක් බඳවාගෙන සේවයේ යෙදවීම තුළිනි. අපි ඉතා සාර්ථක කාලයක් අවසන් කළෙමු. මෙහෙයුම් කටයුතුවල වැඩිදියුණුවට හේතුවූ ප්‍රමාණවත් සාක්ෂි ලෙස පසුගිය මාස කිහිපය පුරා සිදුවූ වෙනස්වීම්වල ප්‍රතිඵල සැලකිය හැක.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම 2008 වර්ෂයේදී පිහිටුවනු ලැබුවේ බිටුමන් ගල් අඟුරු ආනයනය කිරීමේ එකම ආයතනකරු ලෙස කටයුතු කරමින් ලක්විජය ගල් අඟුරු බලාගාරයට (LVCPP) ගල් අඟුරු ආනයනය කොට සැපයීමේ ප්‍රධාන අරමුණ ඇතිව ය. බල උත්පාදනය ප්‍රකාරව ලක්විජය ගල් අඟුරු බලාගාරයට (LVCPP) මෙ.වො. 900 ක ධාරිතාවක් ජනනය කිරීමේ හැකියාවක් තිබෙන අතර එය ජාතික බලශක්ති ජාලයේ විශ්වාලතම සැපයුම්කරුද වේ. එබැවින් ලක්විජය ගල් අඟුරු බලාගාරය (LVCPP) සිය මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව සිදුකිරීම අත්‍යාවශ්‍ය වේ. මේ අන්තයෙන් බැලීමේදී අමුද්‍රව්‍ය සැපයීමේ එකම සැපයුම්කරු ලෙස ඒවා නිවැරදි අවස්ථාවේදී සහ නියම මිලට, නියම තත්ත්වයෙන් සහ නිවැරදි ප්‍රමාණයෙන් සැපයීමට සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සිය බැඳීම යටතේ වගකීමෙන් යුතුව කටයුතු කරයි. සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් මෙම වගකීම ඉතා උද්‌යෝගයෙන් යුතුව වසර පුරාවට ඉටුකර ඇත.

2016-17 කාලය සඳහා ගල් අඟුරු අවශ්‍යතාවය මෙ.ටො. 2,200,000 ක් වූ අතර එම කාලය තුළ සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් ගල් අඟුරු මෙ.ටො. 2,209,983 ක් සපයා ඇත. ඉල්ලුම් සන්තෘප්ති අනුපාතය ගණනය කිරීමේදී එය 100.6% ක අගයක් ගනී.
පිරිවැය ආශ්‍රිත අඩු ගුණාත්මකභාවයෙන් යුත් කිසිඳු අමුද්‍රව්‍යයක් ලබා නොදෙමින් එක් එක් තත්ත්ව උපමානයන් සඳහා ප්‍රාමාණික අගය පරාශයන්ට යෝග්‍ය වන පරිදි ගල් අඟුරු සැපයීමට සමාගම නිරන්තරයෙන් කටයුතු කළ බව මම සතුටින් සඳහන් කරමි.

සියලු පාර්ශවකරුවන් (Stakeholders) අතර කාර්යක්ෂම සහ ඵලදායී සම්බන්ධීකරණයක් ඇතිව සෑම අමුද්‍රව්‍යයක්ම නිවැරදි වේලාවට සැපයීමට සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමට හැකිවී ඇත. අමුද්‍රව්‍ය වරායෙන් නිදහස් කිරීමේදී දැරීමට සිදුවන වරාය ප්‍රමාද ගාස්තු අවම කරමින් පිරිවැය කාර්යක්ෂමව කටයුතු කිරීමට හැකිවීම නිසා එය කාර්යක්ෂම අමුද්‍රව්‍ය සැපයීමක් බවට අපි පවසමු. ලක්විජය ගල් අඟුරු බලාගාරය (LVCPP) මගින් නිරන්තරව අප වෙත ලබාදෙන නියමිත කාලය තුළ අමුද්‍රව්‍ය සැපයීමට හැකිවීම නිසා එය ඵලදායී අමුද්‍රව්‍ය සැපයීමක් බවට අපි පවසමු.

පෞද්ගලික අංශයට ගල් අඟුරු සැපයීම පුළුල් කරමින් දේශීය වෙළඳපොල අවබෝධ කරගැනීමේ අවශ්‍යතාවය සමාගම විසින් බොහෝ කාලයක සිට හඳුනාගෙන ඇත. රටට ගල් අඟුරු ආනයනය කිරීමේ අවසරලත් එකම ආයාතකරු ලෙස සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම බවට පත්කිරීමේ අදහස අපි ප්‍රවර්ධනය කරමින් සිටිමු. මෙය, 2018 වර්ෂයේ අයවැය තේමාව වූ 'හරිත ආර්ථිකයක්' ඇතිකිරීමට පෙළගැසෙමින් ඉටුකළ යුතු ප්‍රයෝජ්‍ය සංකල්පයකි. කෙසේ වෙතත්, විදුලි බල මණ්ඩලය සමග පවතින ගිවිසුමට අනුව වෙළඳ ආදායම් හෝ සේවා/ ගාස්තු වශයෙන් ආදායම් උත්පාදනය කිරීම ගල් අඟුරු සමාගමට කල නොහැකි අතර එම ආදායම් පොදු කාර්ය පිරිවැය සමග හිලව් කිරීම සිදුකරයි. සැබැවින්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ සීමාසහිත ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ අධීක්ෂණ කමිටුව විසින් අපව ලාභ උත්පාදනය සඳහා ධෛර්යමත් කිරීම නිසා සමාගමේ උපාය මාර්ගික කටයුතු සාර්ථක වී ඇත.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමට සේවය කිරීමේදී මා වෙත දැක්වූ විශ්වාසය වෙනුවෙන් ගරු අමාත්‍යතුමාට, ගරු රාජ්‍ය අමාත්‍යතුමාට සහ ලේකම්තුමාට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි. ලං.වි.බ. මණ්ඩලයේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ මිත්‍ර අධ්‍යක්ෂකවරුන් බෙදාහදා ගත් දැනුම අමිල ය. සාර්ථක කාලයක් සම්පූර්ණ කිරීමට කාර්යමණ්ඩලයේ සෑම මට්ටමකම නිලධාරීන් විසින් දැක්වූ සහයෝගයට මම ස්තූතිවන්ත වෙමි. විවිධාකාරයෙන් සහයෝගය දැක්වූ කොටස්කරුවන්ට, බැංකුකරුවන්ට, සමාගම් ලේකම්වරුන්ට සහ විගණකවරුන්ටද මම කෘතඥ වෙමි.



එස්.සී. ලක්සුමනගේ
සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ

කාර්යසාධන සමාලෝචනය

1. හැඳින්වීම

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ මෙහෙවර වන්නේ ලක්විජය ගල් අඟුරු බලාගාරය (LVCPP) මගින් විදුලි බලය උත්පාදනය කිරීම පිණිස ඉහළ ප්‍රමිතියකින් යුත් ගල් අඟුරු නියම මිළට සැපයීම, ගල් අඟුරු දහනයේදී විමෝචනය වන ද්‍රව්‍ය කළමනාකරණය කිරීම, ඒවා පරිසර හිතකාමී නව්‍ය නිෂ්පාදන බවට පරිවර්තනය කිරීම සහ එකී නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වාදීම, තාප බලශක්ති ප්‍රභවයක් ලෙස ගල් අඟුරු පෞද්ගලික අංශය සඳහා ප්‍රවර්ධනය කිරීම, කර්මාන්තකරුවන් වඩා ශක්තිමත් කිරීම සහ එමගින් රටේ සංවර්ධනයට දායකවීම වේ.

මෙහෙයුම් දෘෂ්ඨිකෝණයකින් බලන්නේ නම් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම පිහිටුවනු ලැබුවේ බිටුමන් ගල් අඟුරු ආනයනය කොට ඒවා ලක්විජය ගල් අඟුරු බලාගාරය (LVCPP) වෙත සැපයීමට ය. සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ වගකීම වන්නේ සැපයුම්කරුවන් ලියාපදිංචියේ සිට සියලුම ක්‍රියාකාරකම් ඉටු කිරීම, ටෙන්ඩර් කැඳවීම සහ නිම කිරීම, ගල් අඟුරු ප්‍රසම්පාදනය කොට ලක්විජය ගල් අඟුරු බලාගාරයේ (LVCPP) ජැටිය වෙත සැපයීම ය. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම මුහුණපාන අනෙක් අභියෝගය නම් නියමිත කාලයක් සඳහා අවශ්‍ය කරනු ලබන මුළු ගල් අඟුරු ප්‍රමාණයම ඊළඟ වර්ෂයේ ඔක්තෝම්බර් සිට අප්‍රේල් මාසය දක්වා වූ මාස හතක කාලය තුළ සැපයීම ය.

2. ප්‍රධාන ක්‍රියාකාරකම

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් ඉටු කරනු ලබන ක්‍රියාකාරකම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ පුළුල් ලෙස වර්ග කළ හැකි ය.

i) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, ටෙන්ඩර් ක්‍රියාවලිය සහ ප්‍රදානය කිරීම.

ii) ණයවර ලිපිය විවෘත කිරීම, බැංකුකරුවන් සමග සම්බන්ධතා පවත්වා ගැනීම, බැංකු පහසුකම් විධිමත් කිරීම, භාණ්ඩාගාර ඇපකර සහ ලේඛන පවත්වා ගැනීම.

iii) ප්‍රසම්පාදනය, ගල් අඟුරු පැටවූ ස්ථානයේ සිට ජැටිය දක්වා මාරු කිරීම සඳහා ප්‍රවාහනය කිරීම සහ බත්තල් සේවා.

iv) ලක්විජය ගල් අඟුරු බලාගාරය (LVCPP), සැපයුම්කරුවන්, පර්යන්ත මෙහෙයුම්කරුවන්, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා නාවික හමුදාව, සීමාසහිත ලංකා නැව් සංස්ථාව ආදිය සමග සම්බන්ධතා පවත්වා ගැනීම සහ පාර්ශවකරුවන් (stakeholders) අතර විවිධ මෙහෙයුම් සම්බන්ධීකරණය.

v) සපයන ලද ප්‍රමාණය සත්‍යාපනය කිරීමෙන් පසුව සහ තත්ත්ව ගැලපුම් සූත්‍රය අදාල කරගනිමින් ඉන්වොයිසියේ වටිනාකම්න් 80% ක් සහ 20% ක් නිදහස් කිරීම පිණිස තහවුරු කිරීමේ ලිපිය (LOC) සහ භාර ගැනීමේ ලිපිය (LOA) නිකුත් කිරීම.

3. වාණිජ අරමුණු ක්‍රියාවේ යෙදවීම


සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සංස්ථාපනය කරනු ලැබූ මුල් වර්ෂ තුළ ලං.වි.බ මණ්ඩලයට සපයනු ලැබූ ගල් අඟුරු වෙනුවෙන් ගාස්තුවක් අයකර ගැනීම පිණිස සමාගම විසින් මෙට්‍රික් ටොන් 01ක් සඳහා පදනම් මිලක් භාවිතා කරනු ලැබී ය. එබැවින් සමාගමේ කාර්යසාධනය මිණුම්කල හැකි විය. 2014 වර්ෂයේ සිට ලං.වි.බ. මණ්ඩලය විසින් මිළ ව්‍යුහය වෙනස් කළ අතර, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ ශුද්ධ පොදුකාර්ය පිරිවැයට සමාන ගාස්තුවක් එම සමාගම විසින් ආදායමක් ලෙස ඉදිරිපත් කරනු ලැබී ය.ශුද්ධ පොදුකාර්ය පිරිවැය අර්ථ දක්වනු ලැබුවේ දළ පොදුකාර්ය පිරිවැය සහ සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් උපයනු ලැබූ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු, පොලී ආදී අනිකුත් ආදායම්වල ශුද්ධ පිරිවැය ලෙසිනි.

කාර්යසාධන සමාලෝචනය

ශුද්ධ පොදුකාර්ය පිරිවැය පදනම් ගාස්තු ක්‍රියාවේ යෙදවීමත් සමග වාණිජ යොමුව ක්‍රියාවේ යෙදවීම ප්‍රතිස්ථාපනය කරනු ලැබුවේ අඩුතර පිරිවැය වෙනුවට ය. එවක් පටන් මූලාශ්‍රයේ උපරිම පිරිවැය සහතික කිරීම සඳහා යම් මිණුම් ලකුණු භාවිතා කර ඇත.

i) නැව තෙක් නොමිලේ (FOB)

ගල් අඟුරු ප්‍රසම්පාදනය කරගැනීම සිදුකරන්නේ නැව තෙක් නොමිලේ (FOB) මත ය. ප්‍රසම්පාදනයේ දී පිරිවැය කාර්යක්ෂමතාවය මැනීමට භාවිතා කරනු ලබන මිණුම් ලකුණ වන්නේ කි.කැ./කි.ග්‍රෑ 6000 NAR ගල් අඟුරු (API 4) දකුණු අප්‍රිකාව සඳහා Argus/ McClosky මිළ දර්ශකය ය [6000 kcal/kg NAR coal (API 4)]. එක් එක් කාලය සඳහා සාමාන්‍ය දර්ශකය සමග ගලපන ලද නැව තෙක් නොමිලේ (FOB) හි ප්‍රස්ථාරික සැසඳීම පහත දක්වා ඇත. ගලපන ලද නැව තෙක් නොමිලේ (FOB) යනු ලං.වි.බ. මණ්ඩලයේ පිරිවිතරවලට තත්ත්ව විචලන සඳහා මිල ගැලපීම්වලට යටත් වන මිල ගණන් ඉදිරිපත් කිරීම් ය. මෑත වර්ෂවලදී FOBT, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කාර්යක්ෂම මිලදී ගැනීමේ සාක්ෂිය වන සාමාන්‍ය දර්ශකය සහිතව මිළ ස්පර්ශ රේඛාවකින් චලනය වී ඇති බවට සාක්ෂි දරයි.




ii) ගෙන ඒමේ කුලිය

පිරිවැය දැරිය යුතු අනෙක් ඉතා බරපතල ක්‍රියාකාරකම වන්නේ ගල් අඟුරු පටවනු ලබන වරායේ සිට ලක්විජය ගල් අඟුරු බලාගාරයේ (LVCPP) ජැටිය දක්වා ගෙනගොස් සැපයීමට දැරිය යුතු සියලුම වියදම් ය. සීමාසහිත ලංකා නැව් සංස්ථාව (CSCL) වරලත් මෙහෙයුම්කරු වන අතර සංස්ථාව සතු නැව් යෙදවීමට අමතරව ලේඛනගත නැව් පෙළගැසීම් වලට අදාලව නැව් නම් කිරීම සඳහා අනිකුත් නැව් සමාගම් සමග අතරමැදියා වශයෙන්ද කටයුතු කරයි. ගැල් කුලී දැරීම පිණිස සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් නැව් ගාස්තු මිල ගණන් කැඳවනු ලබයි. එහෙත් මිල ගණන් සංසන්දනය කිරීමට සහ ගැල් කුලී සහ බත්තල් සේවාවන් සුරක්ෂිත කිරීම සඳහා පෙර විකිණීමේ අයිතිය සීමාසහිත ලංකා නැව් සංස්ථාවට ඇත.එබැවින් එය තරඟකාරී ක්‍රියාවලියකි. මෙ.ටො. 1 ක් සඳහා ගැල් කුලී සහ බත්තල් ගාස්තු අනුපිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 11.50 ක් සහ එක්සත් ජනපද ඩොලර් 3.00 ක් ලෙස වර්ෂය පුරා නොවෙනස්ව පැවතින.

iii) ප්‍රමාද ගාස්තු


ප්‍රමාද ගාස්තු සඳහා දැරිය යුතු පිරිවැය - ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පෙර වර්ෂ තුළදී පිරිවැය අකාර්යක්ෂමතාව ඇති කරමින් සැලකිය යුතු ඉහළ අගයක පැවතුනි. කෙසේ වෙතත් උපක්‍රම්ව කළමනාකරණය තුළින් සහ සැපයුම් දාමය සමග සම්බන්ධ අය අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීම මගින් මෙම පිරිවැය ක්‍රම ක්‍රමයෙන් පාලනය කර ගැනීමට සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමට හැකි විය. මෙයින් ලැබූ ප්‍රතිඵලය ප්‍රමාණවත් වූ අතර එය පහත රේඛා රූප සටහන මගින් පෙන්නුම් කරයි.

කාර්යසාධන සමාලෝචනය




iv) **පොදුකාර්ය පිරිවැය**

මෙ.ටො. 1 ක් සඳහා ශුද්ධ පොදුකාර්ය පිරිවැය මගින් මනිනු ලබන පරිදි පිරිවැය කාර්මක්ෂමතාව වසර දෙකක් තුළ ක්‍රමයෙන් අඩු - වැඩි වුවද සමස්ථයක් ලෙස එය ක්‍රමික පහත වැටීමකි. පිරිවැය කාර්යක්ෂමතාව ප්‍රධාන වශයෙන් දක්වනු ලබන්නේ පොදුකාර්ය පිරිවැයේ සමානුපාතික වැඩිවීමට වඩා අඩුවෙන් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමට ප්‍රසම්පාදනය කළ හැකි වූ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය මගිනි.



v) **ඉල්ලුම් සංතෘප්තිය**

පසුගිය වසර දෙක තුළ ලක්විජය ගල් අඟුරු බලාගාරයේ (LVCPP) ඉල්ලුම සම්බන්ධයෙන් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම පූර්ණ වශයෙන් සෑහීමට පත්ව ඇති බවට පහත සඳහන් ප්‍රස්තාරික නිරූපණය සාක්ෂි දරයි.



vi) **ගල් අඟුරුවල තත්ත්වය**

ගල් අඟුරුවල තත්ත්වය මනිනු ලබන්නේ දළ තාපජනක අගය (GCV), මුළු තෙතමනය, අඩංගු වන අළු ප්‍රමාණය, වාෂ්පශීලී ද්‍රව්‍ය, ගෙන්දගම් (සල්ෆර්) ප්‍රමාණය, hardgrove grindability දර්ශකය වැනි මිනුම් කිහිපයක් භාවිතයෙනි. එක් එක් ගල් අඟුරු නැව් බඩු තොගය පටවන සහ නිදහස් කරන වරායේදී ඒවායේ තත්ත්ව විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කිරීම පිණිස ලං.වි.බ. මණ්ඩලය විසින් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පරීක්ෂණ සහ විශ්ලේෂණ නියෝජිතායතනයක සේවාවන් ලබාගෙන ඇත.

පහතින් වගුගත කර ඇත්තේ ගල් අඟුරු නැව්බඩු තොගය පටවන සහ නිදහස් කරන වරායේදී ඒවායේ සම්මත අගයන්ට අනාභිමුඛව නියම තත්ත්ව පරාමිතීන්හි සැසැඳීම් සහ විචලනයන් ය.


කාර්යසාධන සමාලෝචනය

පරාමිතිය	ලංකා ගල් අඟුරු සමාගමේ සම්මත අගය	පැටවුම් වරාය උපරිම	පැටවුම් වරාය අවම	පැටවුම් වරාය සාමාන්‍යය	සම්මත අගයේ සිට සාමාන්‍ය විචලනය
දළ තාපජනක අගය (GCV)	6300	6375	6065	6249	-51
අළු ප්‍රමාණය	11	15.85	11.14	14.004	-3.004
මුළු තෙතමනය	12	8.50	5.94	6.709	5.291
වාෂ්පශීලී ද්‍රව්‍ය	31	28.45	22.6	24.472	2.528
ගෙන්දගම් (සල්ෆර්) ප්‍රමාණය	0.5	0.71	0.45	0.503	-0.003
HGI	50	58	51	54.73	4.73

පරාමිතිය	ලංකා ගල් අඟුරු සමාගමේ සම්මත අගය	ගොඩබෑමේ වරාය උපරිම	ගොඩබෑමේ වරාය අවම	ගොඩබෑමේ වරාය සාමාන්‍යය	සම්මත අගයේ සිට සාමාන්‍ය විචලනය
දළ තාපජනක අගය (GCV)	6300	6338	5995	6209	-91
අළු ප්‍රමාණය	11	15.97	11.2	14.206	-3.206
මුළු තෙතමනය	12	7.51	5.97	6.623	5.377
වාෂ්පශීලී ද්‍රව්‍ය	31	28.94	22.56	24.973	2.027
ගෙන්දගම් (සල්ෆර්) ප්‍රමාණය	0.5	0.87	0.41	0.504	-0.004
HGI	50	58	50	54.083	4.083

ඉහත වගු සමාලෝචනය කිරීමේදී සම්මත අගයට අනුව සංසන්දනය කිරීම බොහෝ පිරිවිතරවල සටහන් කර ඇති විචලනයන් වැඩි වශයෙන් සතුටුදායක බවත් අහිතකර විචල්‍යතා පවා වැදගත් නොවන බවත් අනාවරණය කරයි. අනුල්ලංඝනීය තත්ත්ව ප්‍රමිතීන් ඉටු කිරීම හෝ වැඩිදියුණු කිරීම යන්ත්‍රාගාරයේ කාර්යක්ෂමතාවට හොඳ බවට නිමිති පහල කරයි.

ලං.වි.බ. මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන අගයන්ට අනාහිමුඛව සපයනු ලබන ගල් අඟුරුවල දළ තාපජනක අගයේ (GCV) තත්ත්ව පරාමිතීන් දැක්වෙන ප්‍රස්තාරික නිරූපණයක් පහත වගුවේ දැක්වේ.



4. අවදානම් කළමනාකරණය

i) **වෙළඳපොල අවදානම**

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම ගල් අඟුරු මිළ සම්බන්ධ වෙළඳපොල අවදානමට මුහුණ දෙයි. කෙසේ වෙතත් මෙම නිරාවරණය, විවෘත අවදානමක් ලෙසත් එය අඩුවන අනාවරණයක් ලෙසත් අපි අර්ථ දක්වමු. පළමුවෙන්ම සියලුම ටෙන්ටර්, එම ස්ථානීය සහ කාලීනී යන දෙකම (both spot and term), තරඟකාරී ලංසු තැබීම පදනම් කරගෙන සත්‍ය ලෙසින්ම අනුකූල වූ අඩුම මිළ ගණන් ඉදිරිපත් කරනු ලැබූ ලංසුකරු වෙත ප්‍රදානය කරනු ලැබේ. තරඟකාරී ලංසු තැබීම ආරම්භ වන්නේ ඉල්ලුම සහ සැපයුම මගින් දක්වනු ලබන තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කිරීමෙනි. එම අවස්ථාවේදීම මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්වලදී ටෙන්ඩරය යටතේ සියලුම සැපයුම් සඳහා ප්‍රදානය කිරීමේ මිල ස්ථාවරව පවතී. නියමයන්ට අනුව මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්වලදී ප්‍රදානය කරන මාසය සහ නෞහාර බිල්පත් මාසය අතර ආගස් ගල් අඟුරු මිල දර්ශනය විචලනය වන නිසා සැපයුම් මිළ සුනම්‍ය කරනු ලබයි. ඉහත කරුණු හැර, ටෙන්ඩර් පිරිවිතරවලට අනුව මිල/ තත්ත්ව අනුකූලතාව සහතික කිරීම පිණිස තත්ත්ව මිළ ගැලපීම හඳුන්වා දෙනු ලැබේ. එබැවින් ගල් අඟුරු මිළ සම්බන්ධයෙන් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමට තිබෙන අවදානම අඩුවන නිරාවරණයක් වේ.

ii) **ණය අවදානම**

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ එකම මිළදී ගන්නා වන්නේ ලං.වි.බ. මණ්ඩලය වන බැවින් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම ණය අවදානමට නිරාවරණය වන්නේ නැත. කෙසේ වෙතත් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම වර්තමානයේ ණය අයකර ගැනීම සම්බන්ධ නෛතික කටයුතු සහ ව්‍යාපාර-ව්‍යාපාර කටිකා කරගැනීම් සම්බන්ධයෙන් මුළුමනින්ම යොමුවී ඇත. ණය අයකර ගැනීමේ ප්‍රයත්නයන් අතර ප්‍රධාන වශයෙන් පහත සඳහන් ණය දැක්විය හැකි අතර එය මේ වනවිට දීර්ඝ නීතිමය කටයුත්තක්, බේරුම්කරණයක් සහ කටිකා කරගැනීමක් බවට පත්ව ඇත.

සීමාසහිත ලංකා නැව් සංස්ථාව (CSC)
රු. 539,192,079

ඉහත මුදල ඉන්දියාවේ ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම වෙත ගල් අඟුරු සැපයීම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට හිඟව පවතින අතර එකී සැපයුම සඳහා ලංකා සීමාසහිත නැව් සංස්ථාව මැදිහත්වී මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරන ලදි. සීමාසහිත ලංකා නැව් සංස්ථාවට අනුව ඉහත සඳහන් මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ආරවුල විසඳීමේ කාර්යය භාණ්ඩාගාරය, සීමාසහිත ලංකා නැව් සංස්ථාව, ලං.වි.බ. මණ්ඩලය සහ සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම යන ආයතනවලින් එක් සාමාජිකයෙකු බැගින් සාමාජිකයින් 4 දෙනෙකුගෙන් යුත් කමිටුවක් විසින් හසුරුවන ලදි. කමිටුවේ වාර්තාව අමාත්‍ය මණ්ඩල ආර්ථික කළමනාකරණ කමිටුව වෙත යොමු කරන ලද අතර එහි ප්‍රතිචාරය බලාපොරොත්තුවෙන් සිටිමු.

ලිබර්ටි කොමොඩිටිස් ලිමිටඩ්
එක්සත් ජනපද ඩොලර් 1,575,633

සත්‍ය වශයෙන්ම අනුකූල වූ අඩුම මිළ ගණන් ඉදිරිපත් කළ ලංසුරු ලෙස ලිබර්ටි කොමොඩිටිස් ලිමිටඩ් සමාගම වෙත පළමු ස්ථාණීය ටෙන්ඩරය 2015-16 දී ප්‍රදානය කරනු ලැබී ය. කෙසේ වෙතත් තත්ත්ව ගැලපුම් සූත්‍රය මෙහෙයවමින් සහ ප්‍රසාද දීමනා ඉල්ලමින් ලිබර්ටි කොමොඩිඩිස් ලිමිටඩ් ආයතනය ණයවර ලිපිය මත එහි දැක්වෙන මුදලට වඩා වැඩි මුදලක් ලබාගෙන ඇති බවට සොයාගනු ලැබී ය. ලිබර්ටි කොමොඩිටිස් ලිමිටඩ් ආයතනය විසින් වැඩියෙන් ලබාගෙන ඇති මුදල අයකර ගැනීම පිණිස සමාගම විසින් බහුවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. නඩු කටයුතුවලට පහත සඳහන් ක්‍රියාමාර්ග ඇතුලත් ය.

4. අවදානම් කළමනාකරණය

i) වැඩියෙන් ලබාගෙන ඇති මුදල අයකර ගැනීම පිණිස නඩුවක් සමාගම විසින් බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණයේ ගොනුකර ඇත.

ii) මෙම කරුණ සම්බන්ධයෙන් වාණිජ මහාධිකරණයේ උපදෙස් පදනම් කරගෙන සමාන්තර බේරුම්කරන පටිපාටියක් පවතී.

iii) සමාගම වෙත එක්සත් ජනපද ඩොලර් 1,000,000 ක මුදලක් ගෙවන ලෙස නිකුත් කරන ලද අතුරු බේරුම්කරණ ප්‍රදානයට එරෙහිව ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් විසින් ඇපෑලක් ගොනුකර ඇත.

iv) තවද ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් ආයතන විසින් නිකුත් කරන ලද කාර්යසාධන ඇපකරය කැඳවන ලෙස සමාගම විසින් ඉල්ලුම් කර ඇත. කෙසේ වෙතත් ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් ආයතනය විසින් සමාගමට එරෙහිව සිවිල් නඩුවක් ජිනීවාහි ගොනුකර ඇත. අපගේ නඩුවට ජිනීවාහිදී පෙනී සිටීම පිණිස නීතිඥවරුන් අප විසින් නීතිපති දෙපාර්තමේන්තුව හරහා නම් කරන ලදි. කෙසේ වෙතත් කාර්යාසාධන ඇපකරය, ගල් අඟුරු සැපයීමේදී සිදුවන අඩුපාඩුකම් වෙනුවෙන් පමණක් සීමා වන නිසාත් ඇණවුම් කරන ලද ප්‍රමාණය නිසි පරිදි භාරදුන් බවත් භාරගත් බවත් සමාගම විසින් ලිඛිතව තහවුරු කළ නිසාත් අපගේ අධිකරණය විසින් ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් ආයතනයට පක්ෂව තීන්දුව ලබාදෙන ලදි.

අනාගත උපායමාර්ගික සැලසුම්

කෙටිකාලීන උපායමාර්ග සැලසුම්

මෝසම් වැසි කාලයේදී හටගන්නා වඩදිය සහ බාදිය තත්ත්ව හේතුකොට ගෙන ගල් අඟුරු සැපයීම සඳහා සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සතුව වාර වැඩසටහන් ඇත. එබැවින් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමට තිබෙන්නේ ඔක්තෝම්බර් මැද සිට ආරම්භවී අප්‍රේල් මැද කාලය දක්වා අනුයාත වසර දෙකක් අතර වැටෙන මාස හයක කාලයක් පමණි.

ඉදිරියේදී පැමිණෙන 2018/2019 කාලය සඳහා ලක්විජය ගල් අඟුරු බලාගාරයේ (LVCPP) ඉලලුම් අවශ්‍යතාව සපුරාලීම අරමුණු කරගෙන ගල් අඟුරු ප්‍රසම්පාදන වැඩදියුණු කිරීම පිණිස මූලික සාකච්ඡාවක් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් නොරොච්චෝලේ පිහිටි ලක්විජය ගල් අඟුරු බලාගාරයේදී (LVCPP) පවත්වන ලදි. වර්ෂයක කාලය සඳහා ගල් අඟුරු අවශ්‍යතාවය මෙ.ටො. මිලියන 1.92 ± මෙ.ටො. 10% වන අතර මාස 06ක සීමා සහිත කාලය තුල ගල් අඟුරු අවශ්‍යතාව සපුරාලීම පිණිස සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් නෞකා පැමිණීමේ පෙළගැස්මක් වැඩිදියුණු කළ යුතුව ඇත. ඒ අනුව පැමිණෙන කාලය සඳහා ගල් අඟුරු සැපයීමේ සැලැස්ම පහත පරිදි වනු ඇත.

තාවකාලික ප්‍රසම්පාදන කාලසටහන

දීර්ඝකාලීන ටෙන්ඩර්වලින් 2018/2019 කාලය සඳහා විසර්ජන සැලැස්ම

	මෙ. ටොන්
කොන්ත්‍රාත්ගත වූ දීර්ඝකාලීන ටෙන්ඩර් ප්‍රමාණය	2,250,000
2017/2018 කාලය තුළ සපයන ලද ප්‍රමාණය	1,199,000
2018/2019 කාලය තුළ මූලාශ්‍ර කරගත යුතු ඉතිරිය	1,051,000

කෙටිකාලීන ටෙන්ඩර්වලින් 2018/2019 කාලය සඳහා විසර්ජන සැලැස්ම

	මෙ. ටොන්
2018/2019 කාලය සඳහා අවශ්‍ය කරනු ලබන ප්‍රමාණය	1,920,000
කාලීන ටෙන්ඩර වලදී මූලාශ්‍ර කරගත යුතු ප්‍රමාණය	1,051,000
කෙටිකාලීන ටෙන්ඩර වලදී මූලාශ්‍ර කරගත යුතු ප්‍රමාණය	869,000

2018/19 කාලය සඳහා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සඳහා සැපයිය යුතු මුළු නැව්ගත තොග ප්‍රමාණය

අවශ්‍ය කරනු ලබන මුළු ගල් අඟුරු ප්‍රමාණය	Mn මෙ.ටො. 1.92
එක් නැව්ගත කිරීමක අඩංගු ගල් අඟුරු ප්‍රමාණය	මෙ.ටො. 60,000
මුළු නැව් ගණන	නැව් 32

අනාගත උපායමාර්ගික සැලසුම්

මධ්‍යකාලීන උපායමාර්ගික සැලැස්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ මඟපෙන්වීම පහත කරුණු සම්බන්ධයෙන් සිය අවධානය සමාගම විසින් යොමුකර ඇත.

» තරඟකාරිත්වය වැඩිකිරීම පිණිස පුළුල් පදනමක් සහිත ලියාපදිංචි සැපයුම්කරුවන්.

» ගැනුම් මිලෙහි අතරමැදි පිරිවැය වැළැක්වීම අරමුණු කරගෙන ලංසු ඉදිරිපත් කරන ලෙස පතල් හිමියන්ට ආරධනා කිරීම.

» තාප බලශක්ති මූලාශ්‍රයක් ලෙස ගල් අඟුරු පෞද්ගලික අංශය වෙත ප්‍රවර්ධනය කිරීම, කර්මාන්තකරුවන් වඩාත් ශක්තිමත් කිරීම සහ එමගින් රටේ සංවර්ධනයට දායකවීම.

» ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම දැක්ම කරගෙන පුත්තලම වරායේ නැංගූරම් ලා තිබෙන ස්ථානයේ සිට ලක්විජය ගල් අඟුරු බලාගාරයේ (LVCPP) ජැටිය දක්වා බත්තල් සේවා සැපයීම.

» ගල් අඟුරු දහනයේදී විමෝචනය වන ද්‍රව්‍යවලට එරෙහිව කටයුතු කිරීම සඳහා 'හරිත ආර්ථිකය' නමැති සංකල්පය ප්‍රවර්ධනය කිරීම.

» ගල් අඟුරු දහනයේදී නිපදවෙන කාබන් ඩයොක්සයිඩ්, ඔක්සිජන් වැනි නව අතුරු නිෂ්පාදන වෙන් කර ගැනීම.

» මෝසම් වැසි පදනම් වූ මාස 06ක් වූ සැපයුම් කාල සීමාවෙන් ඉවත් වී "දින 365 පුරා සැපයීම" යථාර්තයක් බවට පත් කර ගැනීමට කටයුතු කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය

එස්.සී. ලක්සුමනගේ මහතා
සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ

ඒ.කේ. සමරසිංහ (ඉංජිනේරු) මහතා
අධ්‍යක්ෂ
සාමාන්‍යාධිකාරී - ලං.වි.ම.

ඩී. තිලකසේන (ඉංජිනේරු) මහත්මිය
අධ්‍යක්ෂ
අතිරේක සාමාන්‍යාධිකාරී (උත්පාදන) - ලං.වි.ම.

එම්.අයි. නසාර් මහතා (2018 ඔක්තෝම්බර් මස 30 වෙනි දින සිට නතර කරන ලදි)
අධ්‍යක්ෂ
සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ - සීමාසහිත වන් ස්ටොප් ග්ලෝබල් (පුද්ගලික) සමාගම

එස්.එම්.ඩී.එන්. ධර්මප්‍රිය මහතා
අධ්‍යක්ෂ
සාමාන්‍යාධිකාරී - සීමාසහිත ලංකා නැව් සංස්ථාව

කපිතාන් අතුල හේවාවිතාරණ
අධ්‍යක්ෂ
කළමනාකාර අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා වරාය අධිකාරිය

එන්.පී.ඒ.ආර්. ජයවර්ධන මහතා
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

එම්.සී.එම්. රහමාතුල්ලා මහතා
අධ්‍යක්ෂ

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණිත මුල්‍ය ප්‍රකාශන සමග එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සතුටට පත් වෙයි.

සමාගමේ කටයුතු පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 168 වෙනි ඡේදය ප්‍රකාරව අවශ්‍ය කරනු ලබන තොරතුරු සහ සමහර අමතර තොරතුරු අඩංගු වේ.

සමාගමේ මූලික ක්‍රියාකාරකම් සහ වර්ෂය තුළ කාර්යසාධන සමාලෝචනය.

සමාගමේ මූලික ක්‍රියාකාරකම වන ලංකා විදුලිබල මණ්ඩලයට (CEB) අයත් නොරොච්චෝලේ පිහිටි ලක්විජය ගල් අඟුරු බලාගාරය (LVCPP) සඳහා ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු ආයනනය කොට සැපයීමේ ව්‍යාපාරය වසර තුළ නොවෙනස්ව පැවතින. ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු යනුවෙන් අදහස් කරන්නේ ආනයනය කරනු ලබන ගල් අඟුරු, ලං.වි.බ. මණ්ඩලය විසින් නියම කරනු ලබන විශේෂ තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල විය යුතු බව ය.

මුල්‍ය ප්‍රකාශන

සම්පූර්ණ කරන ලද සමාගමේ මුල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් එහි අධ්‍යක්ෂවරුන් වන එම්. අයි. නසාර් මහතා සහ එන්. පි. ඒ. ආර්. ජයවර්ධන මහත්මිය විසින් විධිමත්ව අත්සන් කර ඇත.

විගණකගේ වාර්තාව

සමාගමේ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ වාර්තාව මුල්‍ය ප්‍රකාශන සමග අමුණා ඇත.

ගිණුම් ප්‍රතිපත්ති

සමාගමේ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ SLFRS/LKAS අඩංගු වන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්තිවලට අනුකූලව වන අතර එහිදී උපයෝගී කරගනු ලැබූ ගිණුම් ප්‍රතිපත්ති, මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 03 හි පිටු අංක 26 සිට 32 දක්වා සඳහන් කර ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් 2,000,000 ක් නියෝජනය කරන පරිදි රු. 20,000,000 ක් විය.

අධ්‍යක්ෂවරුන්

2017.12.31 දිනට කාර්යාල දරන්නන් ලෙස කටයුතු කළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් පහත පරිදි වේ.

එස්.සී. ලක්සුමනගේ මහතා

එන්.පී.ඒ.ආර්. ජයවර්ධන මහත්මිය

බී.ආර්. මඩිහවැව මහතා - 2018 මැයි 10 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය

ඒ.කේ. සමරසිංහ මහතා

ඩී. තිලකසේන මහත්මිය

එම්.අයි. නසාර් මහතා - 2018 ඔක්තෝම්බර් 30 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි නතර කරන ලදි.

* එස්.එම්.ඩී.එන්. ධර්මප්‍රිය මහතා - 2018 මැයි 10 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි.

* එම්.සී.එම්. රහමාතුල්ලා මහතා - 2018 ඔක්තෝම්බර් 30 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි

සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද පත්කිරීම්

* බී.ආර්. මඩිහවැව මහතා - 2017 ජූනි 30 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි

* ආර්. අතුකෝරළ මහතා - 2017 ජූනි 06 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි

* එම්.අයි. නසාර් මහතා - 2017 ජූනි 06 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි

* කපිතාන් ඒ. හේවාවිතාරණ මහතා - 2017 ජූනි 01 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

* ඩී. තිලකසේන මහත්මිය - 2017 ජනවාරි 23 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි

* එම්.ජී.ඒ. ගුණතිලක මහතා - 2017 ජනවාරි 20 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි

* එස්.සී. ලක්සුමනගේ මහතා - 2017 පෙබරවාරි 16 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි

* ජී.ඩී.එම්. ද සිල්වා ගුණසේකර මහතා - 2017 පෙබරවාරි 01 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද ඉල්ලා අස්වීම්

* ඩී.පී.ජී. ප්‍රදීප් මහතා - 2017 සැප්තැම්බර් 25 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඒ වෙනුවට එන්.පී.ඒ.ආර්. ජයවර්ධන මහතා පත් කරන ලදි

* එම්.කේ.සී. සේනානායක මහතා - 2017 ජූලි 12 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඒ වෙනුවට ඩී.පී.ජී. ප්‍රදීප් මහතා පත් කරන ලදි

* ආර්. අතුකෝරළ මහතා - 2017 ජූනි 29 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වෙන ලදි

* එම්.ජී.ඒ. ගුණතිලක මහතා - 2017 ජූනි 06 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වෙන ලදි

* ජී.එස්. ධනතුංග මහතා - 2017 ජූනි 29 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වෙන ලදි

* ජී.ඩී.එම්. ද සිල්වා ගුණසේකර මහතා - 2017 මැයි 31 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වෙන ලදි

* එච්.එම්.එස්.එල්. විරේත්න මහතා - 2017 මැයි 22 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වෙන ලදි

* ඩබ්ලිව්.ඩී.ඒ.එස්. විජයපාල මහතා - 2017 ජනවාරි 23 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වෙන ලදි

* එස්.එම්. ගුණරත්න මහතා - 2017 ජනවාරි 17 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වෙන ලදි

* එම්.අයි.එම්. නසාර් මහතා - 2017 ජනවාරි 16 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වෙන ලදි

වර්ෂය තුළ කිසිඳු ආකාරයක සෘජු හෝ වක්‍රකාරයේ කොන්ත්‍රාත් පදනමින් පත්වීමට අධ්‍යක්ෂවරුන් තුළ උනන්දුවක් නොතිබිණ. සමාලෝචිත ගිණුම් කාලපරිච්ඡේදය තුළ සමාගම සමග අදාල පාර්ශව ගණුදෙනු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 26 හි 38 වෙනි පිටුවේ දක්වා ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

සභාපති/කළමනාකාර අධ්‍යක්ෂගේ පාරිශ්‍රමිකය මූල්‍ය ප්‍රකාශන සඳහා අමතර සටහන් (ඇ) හි 40 වෙනි පිටුවේ දක්වා ඇති අතර අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තුද ඉහත පරිදි අමතර සටහන් (ඇ) හි දක්වා ඇත.

පරිත්‍යාග

සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් කිසිඳු පරිත්‍යාගයක් ලබාදී නොමැත.

දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණවලට අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 09 හි දක්වා ඇත.

සංචිත

2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු සංචිත ප්‍රමාණය රු. මි. 50.5 ක් විය. ඊට අදාල විස්තර මූල්‍ය සටහන් සඳහා සටහන්වල පිටු අංක 23 හි පෙන්වා ඇත.

සේවා නියුක්තිය

2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ සේවක සංඛ්‍යාව 22 ක් විය.

වගකීම් සහ සම්භාව්‍යතා

2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ වගකීම් සහ සම්භාව්‍යතා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 23 හි දක්වා ඇත.

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

විගණකවරුන්

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වෙනි සංශෝධනයේ 154 (1) වගන්තියේ දැක්වෙන ප්‍රතිපාදන ප්‍රකාරව විගණකාධිපති විසින් සිදුකරන ලදි.

සමාගම සඳහා බදු අනුකූලතා සේවාවන් සපයන ලද්දේ කන්සල්ටන්ට් කොන්සෝටියම්, වරලත් ගණකාධිකාරිවරුන් විසිනි.

විගණකගේ කාර්යය හැර සමාගම සම්බන්ධයෙන් විගණකවරුන් වෙත කිසිඳු බැඳියාවක් නොමැත.

සමාගම	විගණකගේ/බදු උපදේශකගේ නම	ගෙවීම් වර්ගය	මුදල රු.
සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම	විගණකාධිපති	විගණන ගාස්තු + ප්‍රතිපූර්ණය කළ හැකි වියදම් (බදු හැර)	දැනුම්දී නොමැත
	කොන්සල්ටන්ට් කොන්සොටියම් වරලත් ගණකාධිකාර සමාගම	ආදායම් බදු ගණනය කිරීම සහ වාර්තා කිරීම	45,000.00

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වෙනි සංශෝධනයේ 154 වගන්තියට අනුකූලව මුල්‍ය වර්ෂය සහතික කිරීමේ විගණකවරයා ලෙස විගණකාධිපති පත්කරනු ඇත.

මෙම වාර්ෂික වාර්තාවට අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපති සහ අධ්‍යක්ෂකවරයෙකු විසින් අත්සන් තබනු ලැබේ.

සභාපති

අධ්‍යක්ෂ

පී.ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලේකම්වරු

2018 නොවැම්බර් 28
කොළඹ

පාලනය

මූල්‍ය සහ මෙහෙයුම් විගණන දෙකම සම්බන්ධයෙන් විගණාධිපති විසින් නිකුත් කර ඇති වාර්තාවල අභිතකර සටහන් අඩංගුවී ඇත. අපි මෙහෙයුම් කටයුතු ගතහොත් ටෙන්ඩර් පටිපාටිය, කිසිඳු උනන්දුවක් නොමැති කළමනාකරණ පාලන, සැපයුම්කරුවන් වෙත සිදුකර ඇති වැඩිතර ගෙවීම්, තත්ත්ව පාලන/තත්ත්ව මිළ ගැලපුම්, විනිවිදභාවය පිළිබඳව ප්‍රශ්න කරමින් අසාර්ථක ලංසුකරුවන් විසින් නිතරන්තරව ගෙන ඇති නෛතික කටයුතු ආදිය සමාගම දුෂ්කර තත්ත්වයකට පත්කර ඇති බවට පෙන්නුම් කරන ගැටළු වේ. මෙකී කරුණුවලින් බොහොමයක් විගණන වාර්තාවල ඉස්මතු කර පෙන්වා ඇත. කෙසේ වෙතත් ටෙන්ඩර් පරිපාටිය විශාලතර ප්‍රමාණයකට විනිවිදභාවයෙන් සිදුකරන ලද අතර එනිසාම කාලපරිච්ඡේදයන් සඳහා තරගකාරී ලංසුකරුවන් අතර ප්‍රදානය කරන ලද ටෙන්ඩර් සම්බන්ධයෙන් විවාදශීලී ගැටළු මතු නොවින. තවද සියලුම විගණන වාර්තාවලට අප විසින් විධිමත්ව ප්‍රතිචාර දක්වා ඇති අතර අඩුලූහඬුකම් නිවැරදි කරගැනීමට නිර්දේශ කරන ලද ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත. අප විසින් ප්‍රතිචාර නොදක්වන ලද විගණන වාර්තා කිසිවක් මෙහි දැක්වෙන දින වනවිට නොමැති බවට අපි තහවුරු කර සිටිමු.

අනුකූලවීම පාලනයේ තිබෙන වැදගත් ලක්ෂණයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමග අනුකූලවීමට වගබලාගනු පිණිස කළමනාකරණය විසින් විශේෂ අවධානයක් යොමුකර ඇත. ඒ අනුව වර්ෂය සඳහා ආදායම් බදු, වැට් වැනි බදු, සේ.අ.අ. සහ සේ.නි.භා.අ. වැනි ව්‍යවස්ථාපිත ගෙවීම් සමාගම විසින් ගෙවා ඇති අතර විධිමත්ව සම්පූර්ණ කරන ලද වාර්තා සපයා ඇත. ගෙවිය යුතු හිඟ ආදායම් බදු පියවීම සම්බන්ධ සාකච්ඡා මේ වනවිට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග සිදුකෙරෙමින් පවතී.

අමාත්‍යාංශයේදී පවත්වනු ලබන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලට (AMC) සමාගම ක්‍රියාකාරීව සහභාගි වෙයි. අප විසින් විගණන වාර්තාවලට ප්‍රතිචාර දක්වා ඇති අතර නිකුත් කරන ලද නිර්දේශ හැකිතාක් දුරට ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර ඇත.

සිදුවූ එකම පසුගාමී කරුණ වූයේ 2017 වර්ෂයේ පළමු කාර්තු තුනේදී සමාගමේ විගණන සහ කළමනාකරණ රැස්වීම නියම කරන ලද දිනවලදී පැවැත්වීමට නොහැකි වීම ය. එයට හේතුව වූයේ විගණන කමිටු රැස්වීමේ නිල බලයෙන්ම සභාපති වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වූ භාණ්ඩාගාරයේ සාමාජිකයාගේ ඉල්ලා අස්වීම ය. ඒ වෙනුවට නව සාමාජිකයෙකු 2017 අවසාන භාගයේදී පත් කරන ලද අතර ඉන් පසුව කාර්තුවකට එක් රැස්වීම බැගින් පැවැත්වීමට අපි උත්සාහ කළෙමු. ඒ අනුව 2018 වර්ෂයේ 3 වෙනි කාර්තුවේ අවසානය දක්වා ඉහත පරිදි කාර්තුවකට එක් රැස්වීම බැගින් පවත්වන ලදි.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කොටස්කරුවන් වෙත

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනිකුත් ව්‍යාකෘත තොරතුරු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

මුල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්තිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම වෙනුවෙන් සහ වංචා හෝ වැරදි හේතුකොට ගෙන ද්‍රව්‍යාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය යැයි හැඟෙන සහ අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලන වෙනුවෙන් මණ්ඩලය වගකිව යුතු ය.

විගණකගේ වගකීම

මාගේ වගකීම වන්නේ මෙම මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ විගණනය පදනම් කරගෙන අදහසක් ප්‍රකාශ කිරීම ය. මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදුකළෙමි. විගණනයේදී මා චාරධර්මීය අවශ්‍යතාවලට අනුකූල විය යුතු බවටත් මුල්‍ය ප්‍රකාශන ද්‍රව්‍යාත්මක අවප්‍රකාශයන්ගෙන් තොරව සාධාරණ සහතිකවීමක් ලබාගැනීම පිණිස මවිසින් විගණනය සැලසුම් කොට සිදුකළ යුතු බවටත් එකී ප්‍රමිතීන් විසින් නියම කරනු ලැබේ.

විගණනයකට මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සංඛ්‍යා සහ අනාවරණය කිරීම් සම්බන්ධයෙන් විගණන සාක්ෂි ලබාගැනීමට අවශ්‍ය කරනු ලබන කෘත්‍යාත්මක පටිපාටීන් මැදිහත් වේ. තෝරාගනු ලබන පටිපාටිය, වංචා හෝ වැරදි හේතුකොට ගෙන මුල්‍ය ප්‍රකාශනවල ද්‍රව්‍යාත්මක අවප්‍රකාශයන්හි අවදානමේ තක්සේරු කිරීමද ඇතුළුව විගණකගේ තීන්දුව මත රඳා පවතී. එකී තක්සේරු කිරීම් සිදුකිරීමේදී විගණන පටිපාටීන් අවස්ථාවට යෝග්‍ය ව සැලසුම් කිරීම පිණිස එහෙත් සමාගමේ අභ්‍යන්තර පාලනයන්හි ඵලදායිතාවය සම්බන්ධයෙන් අදහසක් ප්‍රකාශ කිරීමේ කාර්යය පිණිස නොව සමාගම විසින් මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණව ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් විගණකවරයා සැලකිලිමත් වේ. විගණනයකට, භාවිතා කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිවල අනුරූපතාව ඇගයීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරනු ලබන ගිණුම් ඇස්තමේන්තුවල සාධාරණ බව මෙන්ම මුල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීමේ ඇගයීමද ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මවිසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බවට මම විශ්වාස කරමි.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) රු. 27,478, 878 ක්වූ එකතු කළ අගය මත බද්ද (වැට්), ආර්ථික සේවා ගාස්තු (ESC) සහ රඳවා ගැනීමේ බදු සහ, රු. 11,703,151 ක් වූ අයවිය යුතු සහ ගෙවිය යුතු ලෙස පිළිවෙලින් මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 15 සහ 20 යටතේ පෙන්වා තිබුණි. ඒ සමගම රු. 3,371,326 ක් සහ රු. 12,758,801 ක්වූ අසාමාන්‍ය හර ශේෂයක් පිළිවෙලින් ජාතිය ගොඩනැගීමේ බදු (එන්ටීබී) සහ වැට් බදු ලෙස මුල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් යටතේ පෙන්වා තිබුණි. බදු ගණනය කළ ආකාරය පිළිබඳ විස්තර සහ බදු වාර්තා වැනි උචිත විගණන සාක්ෂිවල නිරූපයෝජ්‍යතාව නිසා විගණනය අතරතුරදී මෙම ශේෂයන් පිළිගත හැකි ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. තවද එකී ශේෂයන් පැහැදිළි කරගැනීම සඳහා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කොට අවශ්‍ය ඵලදායී ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාගම විසින් මෙම වාර්තාවේ දින වනවිට පවා ගෙන නොතිබුණි.

(ආ) මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 22 ට අනුව වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානය වනවිට ආදායම් බදු බැරකම් රු. 65,474,540 ක් විය. කෙසේ වෙතත් එය දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තු වාර්තාවල පෙන්වා තිබුණේ රු. 4,046,601 ක් ලෙසිනි. එසේ හෙයින් මුල්‍ය ප්‍රකාශනවල ආදායම් බදු බැරකම රු. 61,427,939 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලය වෙත සපයන ලද ගල් අඟුරු වෙනුවෙන් ආර්ථික සේවා ගාස්තු (ESC) ගෙවීමට සමාගම බැඳී සිටී. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් මුල්‍ය ප්‍රකාශනවල රු. 159,790,628 ක ප්‍රතිපාදනයක් වෙන් කිරීමට සමාගම අපොහොසත් වී ඇත.

(ඈ) 2016 අංක 20 දරණ එකතු කළ අගය මත බදු පනතට (සංශෝධන) අනුව "ගල් අඟුරු ආනයනය කිරීම සහ සැපයීම" වෙනුවෙන් ලබාදී තිබූ වැට් බද්දෙන් නිදහස් කිරීමේ සහනය 2016 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කර තිබුණි. එබැවින් ගල් අඟුරු ආනයනය කිරීම සහ සැපයීම වෙනුවෙන් වැට් බදු ගෙවීමට සමාගම බැඳී සිටී. කෙසේ වෙතත් පිළිවෙලින් රු. 5,071,823,613 ක් සහ රු. 4,790,535,258 ක්වූ යෙදවුම් වැට් බදු සහ නිමැවුම් වැට් බදු සමාගම විසින් හිණුම්ගත කර නොතිබුණි. තවද රු. 281,288,355 ක්වූ ප්‍රතික්ෂේප කළ හැකි වැට් බදු මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සැලකිල්ලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විකුණුම් පිරිවැය ඊට සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි. එසේම ප්‍රතික්ෂේප කළ හැකි වැට් බදු මුදල වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉන්වොයිසියක් නිකුත් කර නොතිබුණි. එබැවින් සමාගමේ ආදායම රු. 281,288,355 ක් අඩුවෙන් දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් රු. 42,193,253 ක්වූ බදු බැරකම සටහන් කර නොතිබුණි.

(ඉ) විගණනයට ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛනයට අනුව ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු බවට සඳහන් කරමින් රු. 478,179,975 ක මුදලක් මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 19 ට ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත් මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 10 ට අනුව ගල් අඟුරු අඩුවෙන් සැපයීම සහ අනිකුත් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් ලැබිය යුතු අනුරූප මුදල රු. 539,192,079 ක් විය. එසේ හෙයින් ගනුදෙනුව සිදුවූ දින සිට වසර පහක කාලයක් ඉකුත්ව තිබියදී පවා ඉහත කී සංඛ්‍යා දෙක අතර රු. 61,012,284 ක සංසන්දනය නොකළ වෙනසක් නිරීක්ෂණය විය. ඉහත සඳහන් කළ ශේෂය අයකර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් විගණනයේදී ස්ථිර කරගත නොහැකි වූ අතර අයවිය යුතු

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

ශේෂය සඳහා ප්‍රතිපාදන හඳුනා ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. එබැවින් එය මුල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමට බලපෑමක් වේ.

තත්ත්වාගණනය කල මතය

මාගේ අදහස තුළ, තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේදී විස්තර කරනු ලැබූ කරුණුවල බලපෑම හැර, 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ මතයක් මුල්‍ය ප්‍රකාශන මගින් ලබාදෙන අතර එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මුල්‍ය කාර්යසාධනය සහ මුදල් ගැලීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ.

අනිකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) ඡේදය මගින් අවශ්‍ය කරනු ලබන පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම සහ විගණනය සඳහා විෂයපථය සහ සීමාවන් ඉහත සඳහන් කර ඇත. (ආ) මාගේ මතයේදී :

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේදී විස්තර කරනු ලැබූ කරුණුවල බලපෑම හැර විගණනයට අවශ්‍ය කරනු ලැබූ සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මවිසින් ලබාගෙන ඇති අතර මාගේ පරීක්ෂණයෙන් පෙනෙන තාක් දුරට මනා ගිණුම් වාර්තා සමාගම විසින් පවත්වාගෙන ගොස් ඇත.

සමාගමේ මුල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 ඡේදයේ දැක්වෙන අවශ්‍යතා සමග අනුකූල වේ.

පාර්ලිමේන්තුව සඳහා වාර්තාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ දැක්වෙන ප්‍රතිපාදන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාග මේ කටයුතු සම්බන්ධයෙන් 2017 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

2018.11.10

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාවට පිළිතුරු

ඉහත කරුණ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ 2018.10.31 දිනැති වාර්තාවට පිළිතුරු මෙහිලා ඉදිරිපත් කරනු ලැබේ.

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) **රු. 27,478,787 ක් වූ එකතු කල අගය මත බද්ද (වැට්)**
මෙය, නැවිබඩු නිශ්කාශන ඒජන්තවරයා විසින් වැට් බදු කාර්යය පිණිස ගල් අඟුරු තොගයක් අධි තක්සේරු කිරීම හේතුකොට ගෙන ශ්‍රී ලංකා රේගුවට වැඩිපුර ගෙවන ලද ගෙවීමකි. මෙම මුදල ආපසු ලබාගැනීම සඳහා සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් මුදල් ආපසු ලබාගැනීමේ හිමිකම් ඉල්ලීමක් ගොනුකර ඇති අතර ඒ සඳහා නිරන්තර පසුවිපරම් ක්‍රියාවේ යෙදී සිටී.

රු. 11,703,151 ක්වූ ගෙවිය යුතු බදු
ගෙවිය යුතු බදු මුදල රු. 4,046,601 ක් පමණක් බව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර ඇත. එබැවින් ඉහත සඳහන් මුදල තවදුරටත් ගෙවීමට අවශ්‍ය නොවන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය ඇතිව 2018 වර්ෂයේදී එය බෙරුම් කරන ලදි.

රු. 3,371,326 ක්වූ ජාතිය ගොඩනැගීමේ බද්ද (එන්බීටී)
එන්බීටී ගිණුම්ගත කර ඇත්තේ අයවිය යුතු මුදලක් ලෙසට ය. එබැවින් මෙම මුදල ආපසු ලබාගත නොහැකි නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය ඇතිව 2018 වර්ෂයේදී එය බේරුම් කරන ලදි.

රු. 12,758,801 ක්වූ වැට් බදු මුදල
අතිරේක යෙදවුම් වැට් බදු සටහන් කර ඇත්තේ අයවිය යුතු මුදල් ලෙසට ය. දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් එවන ලද 2018.06.14 දිනැති ලිපිය මගින් අතිරේක යෙදවුම් වැට් බදු ආපසු නොගෙවිය යුතු බවට දක්වා ඇත.

ඒ අනුව මෙම මුදල අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය ඇතිව 2018 වර්ෂයේදී බේරුම් කරන ලදි.

(ආ) **රු. 65,474,540 ක්වූ ආදායම් බදු බැරකම**
හිඟව පවතින ආදායම් බදු බැරකම් රු. 4,046,601 ක්වූ බව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර ඇත. එබැවින් ඉහත මුදල තවදුරටත් ගෙවීමට අවශ්‍ය නොවන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය ඇතිව 2018 වර්ෂයේදී එය බේරුම් කරන ලදි.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2017 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

(අ) **ආර්ථික සේවා ගාස්තු (ESC) සඳහා ප්‍රතිපාදන**

ආර්ථික සේවා ගාස්තු (ESC) සඳහා සම්පූර්ණ ප්‍රතිපාදන, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් සිය 2018 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. බැරකම පියවීම පිණිස මුදල් ලබාගැනීම සඳහා සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත 2018.08.10 දිනැතිව ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර එකී කාර්යය සඳහා මුදල් නිදහස් කිරීම අපේක්ෂාවෙන් සිටිමු.

(ඈ) **වැට් බද්ද**

රේගුව සඳහා යෙදවුම් වැට් බදු ලං.වි.බ. මණ්ඩලය විසින් සම්පූර්ණයෙන්ම ප්‍රතිපූරණය කර ඇති බැවින් අමතර ආපසු අයකර ගත නොහැකි වැට් බදු නොමැත. ගිණුම් පිළියම අදාල කරගැනීම පිණිස සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් වැට් අයවිය යුතු/ගෙවිය යුතු පාලන ගිණුමක් සාදා ඇත.

ගල් අඟුරු විකිණීමේදී අන්තරයක් (margin) අප විසින් එකතු නොකරන නිසාත් අප විසින් රේගුවට ගෙවනු ලබන යෙදවුම් වැට් බදු ලං.වි.බ. මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කරනු ලබන නිසාත් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ පොත්වල අමතර යෙදවුම් වැට් පිළිබඳව සඳහනක් නොමැත.

තවද යෙදවුම් වැට් බදු පිරිවැයක් නොවන අතර එනිසා අපි එය ගල් අඟුරු පිරිවැයට එකතු නොකරමු. 2018.06.28 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී අමාත්‍යාංශය විසින් දෙන ලද නියෝගවලට අනුව ලං.වි.බ. මණ්ඩලය වෙත වැට් ඉන්වොයිසි නිකුත් කිරීමේදී අප විසින් රේගු අන්තරයක් (customs margin) එකතු කළද එම ගණනම මුදල් වට්ටම් ලෙස අඩු කරනු ලැබේ.

විදුලි බල මණ්ඩලයේ මූල්‍ය කළමණාකරු විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත එවන ලද ලිපියක් මගින් රේගු අන්තරය එකතු කිරීම විවාදාත්මකව පැවතියද ඒ සඳහා අවසන් තීරණය අප විසින් දැනගත යුතුව ඇත.

(ඉ) **ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැණි වෙතින් අයවිය යුතු මුදල්**

සීමාසහිත ලංකා නැව් සංස්ථාවට අනුව ලැබිය යුතු මුදල් පියවීම සම්බන්ධයෙන් සාකච්ඡා කොට තීරණයකට එළඹීම පිණිස අනුපිළිවෙල අමාත්‍යාංශ විසින් කමිටුවක් පත්කර ඇත. සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් අනාවරණය කර ඇති පරිදි කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර එම කරුණ විසඳීම සම්බන්ධ තීරණය අපේක්ෂාවෙන් සිටිමු.

කමිටු තීරණය සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමට දැනුම් දෙන තෙක් එකී මුදල අයවිය යුතු මුදලක් ලෙස පවතිවනු ඇත.



සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ
සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	Notes	2017 රු.	2016 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	(09)	4,209,157	3,050,976
අනිකුත් ජංගම නොවන වත්කම්	(10)	775,977,718	775,977,718
		780,186,876	779,028,694
ජංගම වත්කම්			
ණයගැතියන් සහ අනිකුත් අත්තිකාරම්	(11)	3,846,703,841	172,933,590
ආපසු ගෙවනු ලබන තැන්පතු	(12)	120,433	120,433
මුල්‍ය වත්කම්	(13)	80,000,000	15,139,726
කාර්යමණ්ඩලය සඳහා ණය	(14)	5,069,886	1,793,370
අයවිය යුතු බදු	(15)	27,478,787	27,478,787
බැංකුවේ තිබෙන මුදල් සහ අත ඇති මුදල්	(16)	2,647,509	8,983,345
		3,962,020,456	226,449,250
මුළු වත්කම්		4,742,207,332	1,005,477,945
ස්කන්ධය සහ බැරකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධන	(17)	20,000,000	20,000,000
රඳවාගත් ඉපැයුම්		50,526,319	50,526,319
		70,526,319	70,526,319
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	(18)	1,576,282	1,896,920
අනිකුත් ජංගම නොවන බැරකම්	(19)	714,965,434	-
		716,541,716	1,896,920
ජංගම බැරකම්			
ණයහිමියන්	(20)	3,882,648,019	864,904,297
උපචිත වියදම්	(21)	7,016,737	2,675,868
ගෙවිය යුතු ආදායම් බදු	(22)	65,474,540	65,474,540
		3,955,139,296	933,054,706
මුළු ස්කන්ධය සහ බැරකම්		4,742,207,332	1,005,477,945

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව පිළියෙල කර ඇත.

බී.ඒ.ඒ. කුමාර - ගණකාධිකාරී

බී. ජයලත් - ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ. අනුමත කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි.

එම්.අයි. නසාර් - අධ්‍යක්ෂ

එන්.පී.ඒ.ආර්. ජයවර්ධන - අධ්‍යක්ෂ

2018.09.04
කොළඹ

මූල්‍ය කාර්යසාධන සහ අනිකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

	Notes	2017 රු.	2016 රු.
ආදායම්	(04)	31,953,254,249	27,576,236,324
සෘජු වියදම් (විකුණුම් පිරිවැය)	(05)	(31,909,923,832)	(27,532,178,190)
දළ ලාභය		43,330,417	44,058,134
අනිකුක් ආදායම්	(06)	4,871,357	6,577,904
පරිපාලන පිරිවැය		(50,042,674)	(51,219,994)
මෙහෙයුම් ලාභය		(1,840,900)	(583,956)
මුල්‍ය ආදායම්	(07)	1,915,285	652,006
මුල්‍ය පිරිවැය		(74,385)	(68,050)
බදුවලට පෙර ලාභය	(08)	-	-
ආදයම් බදු වියදම්		-	-
වර්ෂය සඳහා ලාභය		-	-
වකතු කළා - අනිකුත් විස්තීර්ණ ආදායම්		-	-
මුළු විස්තීර්ණ ආදායම්		-	-

ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය

	කොටස් ප්‍රාග්ධනය රු.	රඳවාගත් ඉපයීම් රු.	එකතුව රු.
2015.01.01 දිනට ශේෂය	20,000,000	50,526,409	70,526,409
පෙර වර්ෂයේ ගැලපීම්	-	-	-
2016.01.01 දිනට ශේෂය	20,000,000	50,526,409	70,526,409
වර්ෂය සඳහා ලාභය		(90)	(90)
2016.12.31 දිනට ශේෂය	20,000,000	50,526,319	70,526,319
2017.01.01 දිනට ශේෂය	20,000,000	50,526,319	70,526,319
පෙර වර්ෂයේ ගැලපීම්	-	-	-
2017.01.01 දිනට ශේෂය	20,000,000	50,526,319	70,526,319
වර්ෂය සඳහා ලාභය	-	-	-
2017.12.31 දිනට ශේෂය	20,000,000	50,526,319	70,526,319

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2017 රු.	2016 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/(භාවිතා කරන ලද) මුදල් ගැලීම		
ආදායම් බදු වියදම්වලට පෙර ශුද්ධ ලාභය	-	-
ක්ෂය කිරීම් සඳහා ගැලපීම්	1,201,925	1,361,024
පාරිතෝෂික ප්‍රතිපාදන සඳහා ගැලපීම්	593,070	429,136
පොළී ආදායම් සඳහා ගැලපීම්	(1,915,285)	(652,006)
මූල්‍ය පිරිවැය සඳහා ගැලපීම්	74,385	68,050
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	(45,905)	1,206,204
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
ණය ගැතියන් හා වෙනත් අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම	(3,673,770,252)	115,137,004
තැන්පතුවල (වැඩිවීම)/අඩුවීම	-	(10,000)
සේවක ණයවල (වැඩිවීම)/අඩුවීම	(3,276,516)	(215,181)
අත්තිකාරම් ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම	-	(26,506,919)
ණයහිමියන්ගේ (වැඩිවීම)/අඩුවීම	3,732,709,155	(68,404,681)
උපචිත වියදම්වල (වැඩිවීම)/අඩුවීම	4,340,869	1,098,166
මෙහෙයුම්වලින් උපයන ලද මුදල්	59,957,351	22,304,594
අඩුකිරීම :		
ගෙවන ලද මූල්‍ය පිරිවැය	(74,385)	
පෙර වර්ෂයේ ගැලපීම්	-	(90)
ගෙවන ලද පාරිතෝෂික	(913,708)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ගැලීම	58,969,258	22,236,454
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම්	(2,360,106)	(2,325,917)
පොළී ආදායම්	1,915,285	652,006
ආයෝජන ක්‍රියාකාරකම්වලින්/(භාවිතා කරන ලද) ලද ශුද්ධ මුදල	(444,821)	(1,673,911)
මුදල් සහ මුදල් සමාන අයිතමවල ශුද්ධ අඩුවීම/(වැඩිවීම)	58,524,438	20,562,543
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන අයිතම	24,123,071	3,560,528
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන අයිතම	82,647,509	24,123,071
මුදල් සහ මුදල් සමාන අයිතම විශ්ලේෂණය		
බැංකුවේ තිබෙන මුදල් - වාසිදායක	2,622,508	8,958,345
අත ඇති මුදල්	25,001	25,001
බැංකුවේ තිබෙන සහ අත ඇති මුදල්	2,647,509	8,983,345
කෙටිකාලීන ආයෝජන	80,000,000	15,139,726
	82,647,509	24,123,071

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

01. වාර්තා කරනු ලබන ආයතනය

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2008 ජනවාරි 01 වෙනි දින ස්ථාපනය කොට ශ්‍රී ලංකාවේ ලියාදිංචි කරන ලද සමාගමකි. සමාගම 100% ක්ම රජයට අයත් ආයතනයක් වන අතර සංස්ථාගත කිරීමේ සිට එහි කොටස් වලින් (stake) 60% ක ප්‍රමාණයකට හිමිකම් කියන ලංකා විදුලිබල මණ්ඩලයේ අනුබද්ධ සමාගමකි. සමාග මේ ලියාපදිංචි කාර්යාලය අංක 51/3, දුටුගැමුණු වීදිය, දෙහිවල යන ස්ථානයේ පිහිටා ඇත.

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ නොරොච්චෝලේ පිහිටි ලක්විජය ගල් අඟුරු බලාගාරයට (LVCPP) අවශ්‍ය කරනු ලබන කාලය තුළ ඉහළ තත්ත්වයෙන් යුත් ගල් අඟුරු නියම මිලට අවශ්‍ය ප්‍රමාණයෙන් සැපයීම ය. සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම ස්ථාපනය කළ වකවානුවේ සිට මෙම වගකීම් ක්‍රියාශිලීව ඉටුකර ඇත. සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ සිට ලක්විජය ගල් අඟුරු බලාගාරයේ (LVCPP) ජැටිය දක්වා ගල් අඟුරු සැපයීම දක්වා වූ සියලුම ක්‍රියාකාරකම් ඉටු කරයි. සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් ඉටු කරනු ලබන මෙකී ක්‍රියාකාරකම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ පුළුල් ලෙස වර්ග කල හැකි ය.

1. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, ටෙන්ඩර් පරිපාටිය සහ ටෙන්ඩර් ප්‍රදානය.

2. ණයවර ලිපිය විවෘත කිරීම, බැංකුකරුවන් සමග සම්බන්ධතා පවත්වා ගැනීම, බැංකු පහසුකම් විධිමත් කිරීම, සහ ලේඛන කටයුතු පවත්වා ගැනීම.

3. ප්‍රසම්පාදනය, ගල් අඟුරු පැටවූ ස්ථානයේ සිට ජැටිය දක්වා මාරු කිරීම සඳහා ප්‍රවාහනය කිරීම සහ බත්තල් සේවා.

4. ලක්විජය ගල් අඟුරු බලාගාරය (LVCPP), සැපයුම්කරුවන්, පර්යන්ත මෙහෙයුම්කරුවන්, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා නාවික හමුදාව, සීමාසහිත ලංකා නැව් සංස්ථාව ආදිය සමග සම්බන්ධතා පවත්වා ගැනීම සහ පාර්ශවකරුවන් (stakeholders) අතර විවිධ මෙහෙයුම් සම්බන්ධීකරණය.

වර්ෂය අවසානය වනවිට සමාගමේ සේවක සංඛ්‍යාවේ සාමාන්‍ය ගණන 22 ක් විය.
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 සැප්තැම්බර් 04 වෙනි දින නිකුත් කළ යුතු බවට අනුමත කරන ලදි.
පිටු අංක 25 සිට 41 දක්වා වන මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මුල්‍ය ප්‍රකාශනවල අනුකලන කොටසක් වේ.

02. පිළියෙල කිරීමේ පදනම

2.1 සමාගමේ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්තිවලට (SLFRSs and LKASs) අනුකූලව සහ සමාගම් පනතේ දැක්වෙන අවශ්‍යතාවලට අනුකූලව වන අතර අදාල අනාවරණය කිරීම් අවශ්‍ය පරිදි ලබා දේ.

වර්ෂය තුළ අනුගමනය කරන ලද සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති සටහන් අංක 3.1 සිට 3.15 දක්වා අඩංගු වේ. උචිත SLFRSs සහ LKASs, www.casrilanka.com යන වෙබ් අඩවියෙන් ලබාගත හැකි ය.

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ එහිලා සිදුකර ඇති අනාවරණය කිරීම්, සටහන් අංක 3,9.1 හි විස්තර කර ඇති නව ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්තිය උපයෝගී කරගැනීමේදී අවශ්‍ය කරනු ලබන වෙනස්කම් දැක්වෙන අදායම් ප්‍රකාශය හැර පෙර අනුගමනය කරන ලද ඉදිරිපත් කිරීම්වලට අනුකූල වන අතර එය සංස්ථාගත කර ඇත.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 ඇගයීම සඳහා පදනම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ උපචිත පදනමක් මත වන අතර වෙනත් හැටියකින් සඳහන් වුවහොත් මිසක වෙතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ ය.

2.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ දැක්වෙන ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් ප්‍රකාරව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවෙන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ.

2.4 ඇස්තමේන්තු, තීන්දු සහ උපකල්පන භාවිතය

ගිණුම් ප්‍රතිපත්ති අදාල කරගැනීමට බලපාන සහ තීන්දු ගැනීමට, ඇස්තමේන්තු කිරීමට සහ උපකල්පනය කිරීමට සහ වාර්තා කරනු ලබන දිනට වාර්තාගත වත්කම් ප්‍රමාණය, බැරකම්, ආදායම් සහ වියදම් සහ, අසම්භාව්‍ය බැරකම් අනාවරණය කිරීමට අවශ්‍ය කරනු ලබන මූල්‍ය ප්‍රකාශන SLFRS/ LKAS ට අනුකූලව කළමනාකරණය විසින් පිළියෙල කළ යුතු ය. තථ්‍ය ප්‍රතිඵල එකී ඇස්තමේන්තු සහ තීන්දුමය තීරණාවලින් වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන සමාලෝචනය කරනු ලබන්නේ ඉදිරියට යන පදනම මත ය. ගිණුම් ඇස්තමේන්තුව සඳහා සංශෝධන හඳුනාගනු ලබන්නේ, සංශෝධනය බලපාන්නේ එකී කාලපරිච්ඡේදයට පමණක් නම් හෝ සංශෝධනය කරනු ලබන කාලය තුළ සහ, සංශෝධනය බලපාන්නේ වර්තමාන සහ අනාගත යන කාලපරිච්ඡේද දෙකටම නම් අනාගත කාලපරිච්ඡේදයේදී සහ ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන කාලපරිච්ඡේදයේදී ය.

2.5 කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.6 ගිණුම් ප්‍රතිපත්ති, වෙනස්කම් සහ සංසන්දනාත්මක තොරතුරු

සඳහන් කර ඇති විටෙක හෝ වෙනත් හැටියකින් මිසක සටහන් අංක 3.9.1 හි විස්තර කර ඇති ගිණුම් සැලකිල්ලට ගනිමින් සමාගම විසින් අදාල කරගනු ලබන ගිණුම් ප්‍රතිපත්ති ආදායම් සහ විකුණුම් පිරිවැය හඳුනාගැනීමේ අවස්ථාවේදී හැර පෙර වර්ෂයේ භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තිවලට ගැලපේ. පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල කරගැනීම පිණිස අවශ්‍ය ඕනෑම අවස්ථාවක පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත සකස් කර ඇත.

2.7 ශේෂ පත්‍රයේ දිනට පසුව සිදුවන අවස්ථා

සියලුම ද්‍රව්‍යාත්මක පසු ශේෂ පත්‍ර අවස්ථා සැලකිල්ලට ගෙන ඇති අතර උචිත ගැලපීම් හෝ අනාවරණය කිරීම් මූල්‍ය ප්‍රකාශන සඳහා අනුපිලිවෙල සටහන්වල සිදුකර ඇත.

03. සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති

3.1 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් මුදල් හෝ සමාගමේ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත මුදලින් උපලබ්ධි කරගැනීමට අපේක්ෂා කරනු ලබන වත්කම් යන අවස්ථා දෙකෙන් වඩාත් කෙටි කලකින් සිදුකර ගත හැකි වත්කම් වේ. ජංගම වත්කම් හැර අනිකුත්

වත්කම් වන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට වසරට වඩා ගිය කාලයක් සමාගම විසින් දරා සිටීමට අදහස් කරනු ලබන වත්කම් වේ.

3.2 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සඳහන් කරනු ලබන්නේ අඩු පිරිවැය සමුච්චිත ක්ෂය කිරීම සහ යම් සමුච්චිත අපහායනය කිරීමේ අගය මත ය. දේපළ, පිරියත සහ උපකරණවල යම් අයිතමයක පිරිවැය අඩංගු වන්නේ එහි ගැණුම් මිළ සහ එකී වත්කමේ අදහස් කරන භාවිතය සඳහා කාර්ය තත්ත්වයට ගෙනඒමට සෘජුවම දැරීමට සිදුවන යම් පිරිවැය වේ.

ස්වයං නිමවන ලද වත්කම්වල (self - constructed assets) පිරිවැයට ඇතුළත් වන්නේ ද්‍රව්‍ය සඳහා යන පිරිවැය, සෘජු ශ්‍රමික පිරිවැය සහ එකී වත්කම්වල අදහස් කරන භාවිතය සඳහා කාර්ය තත්ත්වයට ගෙනඒමට සෘජුවම දැරීමට සිදුවන යම් වෙනත් පිරිවැය වේ. මෙයට භාණ්ඩ කොටස් කර ගැලවීමට, ඉවත් කිරීමට සහ ඒවා ස්ථානගත කරනු ලබන ස්ථානයේ නැවත සකස් කිරීමට දැරිය යුත පිරිවැයද ඇතුළත් වේ.

ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස යම් වත්කමක ධාරණ වටිනාකම (carrying amount) වැඩිවන්නේ නම් එකී වැඩිවීම ප්‍රත්‍යාගණන සංචිතය නැමැති ශීර්ෂය යටතේ ස්කන්ධයට සෘජුවම බැර කළ යුතු ය. කෙසේ වෙතත් අඩුවීමක් සිදුවී ඇත්නම් එය, එකී වත්කම සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයේ පවතින යම් බැර ශේෂයක ප්‍රමාණයට ප්‍රත්‍යාගණන සංචිතය නමැති ශීර්ෂය යටතේ ස්කන්ධයට සෘජුවම හර කළ යුතු ය.

දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගයන් (carrying values) අපහායනය කිරීම සඳහා සමාලෝචනය කරනු ලබන්නේ ධාරණ අගය ආපසු අයකර ගත නොහැකි බවට තත්ත්වයක් හෝ වෙනසක් පෙන්වනු ලබන අවස්ථාවලදී ය.

3.3 පසුකාලීන වියදම් (Subsequent Expenditure)

දේපලක කොටසක, දේපල, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට යන වියදම හඳුනාගනු ලබන්නේ එකී කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එනු ඇති බවට සසම්භාවී නම් සහ එහි පිරිවැය විශ්වාස කළ හැකි පරිදි මැනිය හැකි නම් එකී අයිතමයේ ධාරණ වටිනාකම තුළ ය. ප්‍රතිස්ථාපනය කරනු ලබන කොටස්වල ධාරණ වටිනාකම පහත දක්වා ඇති හඳුනා නොගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලව හඳුනා නොගැනීමේ කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල සිදුකරනු ලබන වඩිනෙදා සේවා කටයුතුවල පිරිවැය දරනු ලබන ආකාරයට ලාභ හෝ පාඩු ලෙස හඳුනාගනු ලැබේ.

3.4 හඳුනා නොගැනීමේ සහ ක්ෂය කිරීම්

හඳුනා නොගැනීම

දේපළ, පිරියත සහ උපකරණ හඳුනා නොගැනීම නතර කරනු ලබන්නේ ඒවා ප්‍රතිස්ථාපනය හෝ අපහරණය කරනු ලබන අවස්ථාවේදී හෝ ඒවා භාවිතා කිරීමෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවලදී ය. වත්කම හඳුනා නොගැනීම හේතුකොට ගෙන සිදුවන යම් ලාභයක් හෝ අලාභයක් වෙතොත් එය එකී වත්කම හඳුනා නොගැනීම කරනු ලැබූ වර්ෂයට අදාල ආදයම් ප්‍රකාශයට අතුළත් කරනු ලැබේ.

ක්ෂය කිරීම්

ක්ෂය කිරීම් ගණනය කරනු ලබන්නේ දේපළක, පිරියත සහ උපකරණයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මත සරල රේඛීය පදනමක් මත ය. මූල්‍ය කල්බදු යටතේ ලබාගත් වත්කම් ක්ෂය කරනු ලබන්නේ කල්බදු කාලය කෙටිවීම මත සහ තුල්‍ය හිමි වත්කම්වල (equivalent owned assets) ආයු කාලය මත ය.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ. බද්දට ගෙන වැඩිදියුණු කිරීමට ලබාගෙන ඇති වත්කම් බදු කුලී ගිවිසුමට අනුව වසර 2 ක කාලයක් තුළ ක්ෂය කරනු ලැබේ.

වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය භාවිතයට තිබෙන අවස්ථාවේදී වන අතර එකී ක්ෂය කිරීම, වත්කම විකුණනු ලබන හෝ හඳුනා නොගැනීම නතර කරනු ලබන බවට වර්ගීකරණය කළ දිනවලින් කලින් එළඹෙන දින සිට නතර කරනු ලැබේ.

ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සින්නක්නර ඉඩම් හැර එවැනි වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය මත එවැනි ගණන් හිලව් කිරීම පිණිස සියලුම දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තක්සේරු කිරීම මත සරල රේඛීය ක්‍රමයක් භාවිතා කරමිනි.

වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත පරිදි වේ.

වත්කම	අවුරුදු
ගෘහ භාණ්ඩ සහ උපකරණ	5
උපකරණ	4
මෝටර් රථ	4
පරිගණක උපකරණ	4
බද්දට ගෙන වැඩිදියුණු කිරීම	2

වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ශේෂ වටිනාකම සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය වුවහොත් ඒ ඒ මූල්‍ය වර්ෂය අවසානයේදී ගලපනු ලැබේ.

3.5 මූල්‍ය කල්බදු

බද්දට ගත් අයිතමවල හිමිකමට ආනුශංගික සියලුම අවදානම් සහ ප්‍රතිලාභවලට සැලකිය යුතු ඵලදායී ලෙස සමාගමට මාරු කරන මූල්‍ය කල්බදු යටතේ ගනු ලැබූ දේපළ, පිරියත සහ උපකරණ; දේපළ, පිරියත සහ උපකරණ යටතේ බදු අයිතම, බද්දට ගත් අයිතම ලෙස වර්ග කොට ඒවායේ වටිනාකමේ පහළ අගයකට සමාන වටිනාකමකට සහ බද්ද ආරම්භ කරනු ලබන අවස්ථාවේදී අඩු සමච්චිත ක්ෂය වටිනාකමක් යටතේ අවම බදු ගෙවීමේ වර්තමාන අගයකට සඳහන් කරනු ලැබේ. ක්ෂය කිරීම සිදුකරනු ලබන්නේ බද්දට ගත් වත්කම් භාවිතා කිරීමෙන් සමාගම අපේක්ෂා කරන කාලපරිච්ඡේදය තුළ ලැබෙන ප්‍රතිලාභ මත ය.

3.6 ණය ලබාගැනීමේ පිරිවැය

ණය ලබාගැනීමේ පිරිවැය හඳුනාගනු ලබන්නේ යම් වත්කමක් දරනු ලබන කාලපරිච්ඡේදය තුළ ඒවා අත්පත් කරගැනීමට, ඉදිකිරීමට හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම ආරෝපණය කළ හැකි යෝග්‍ය වත්කමක අදහස් කරන භාවිතයට හෝ විකිණීම පිණිස සූදානම් කිරීමට ගනු ලබන එකී වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය වූ අවස්ථාවක යම් කාලපරිච්ඡේදයක් තුළ දරනු ලබන වියදමක් ලෙස ය.

3.7 මූල්‍ය මෙවලම්

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති - LKAS 39 මගින් අවශ්‍ය කරනු ලබන පරිදි, මූල්‍ය මෙවලම් හඳුනා ගැනීම සහ ඇගයීම, මුදල් සහ කෙටිකාලීන තැන්පතු, වෙළඳ සහ අනිකුත් අයවිය යුතු මුදල්, වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු මුදල්, ආපසු ගෙවනු ලබන කුලී සහ අනිකුත් තැන්පතු සහ අදාල සමාගම්වලට ගෙවිය යුතු මුදල් ගණන් මූල්‍ය මෙවලම් ලෙස හඳුනාගනු ලැබේ.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මූල්‍ය වත්කම්

(අ) මූලික හඳුනා ගැනීම සහ ඇගයීම

මූල්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ සමාගම මූල්‍ය මෙවලම්වල ගිවිසුම් අනුව ප්‍රතිපාදනවල පාර්ශවයක් බවට පත්වූ විටෙක පමණි.
LKAS 39 විෂයපථය තුළ මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ, ණය සහ අයවිය යුතු මුදල්, කල්පිරුණු අයෝජනවලට රඳවාගනු ලබන, විකිණීමට තිබෙන මූල්‍ය වත්කම්, යෝග්‍ය පරිදි සහ මූලික හඳුනා ගැනීමේදී එකී මූල්‍ය වත්කමේ වර්ගිකරණය නිශ්චය කරනු ලබන සාධාරණ අගයක මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සියලුම මූල්‍ය වත්කම් මූලිකව හඳුනාගනු ලබන්නේ, ආයෝජන - ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයක නොපවතී නම්, ගනුදෙනු පිරිවැයට සෘජුවම ආරෝපණය කළ හැකි වැඩිපුර සාධාරණ අගයක ය.

මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන තැන්පතු, වෙළඳ සහ අනිකුත් අයවිය යුතු මුදල්, ණය සහ අනිකුත් අයවිය යුතු මුදල් ඇතුළත් ය.

ඒකාකාර යෝග්‍ය යෝජනාක්‍රමය (uniformly applicable scheme) යටතේ සහනදායී අනුපාත මත සේවකයින්ට දෙනු ලබන ණය, ඵලදායී පොලී අනුපාතය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයෙහි සඳහන් කරනු ලැබේ. 2017.12.31 දිනට හිඟව පවතින ප්‍රාග්ධන සම්බන්ධයෙන් වන සම්ප්‍රයුක්ත පාඩුව වසරේ අදායම් ප්‍රකාශනයට අයකරනු ලබේ.

(ආ) තදනන්තර ඇගයීම (Subsequent measurement)

1. **කල් පිරීමට රඳවාගනු ලබන ආයෝජන (Held-to-maturity investments)**

කල් පිරීමට රඳවාගනු ලබන ආයෝජන - එය කල් පිරීමට රඳවා ගැනීම සඳහා සමාගමට ධනාත්මක අරමුණක් සහ හැකියාවක් ඇති විටෙක ස්ථාවර හෝ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන වත්කම් සහ ස්ථාවර කල් පිරීම් වේ. මූලික ඇගයීමට පසුව කල් පිරීමට රඳවාගනු ලබන ආයෝජන අගයනු ලබන්නේ ඵලදායී පොලී ක්‍රමය, අඩු අපහායනය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ය. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කරගැනීම මත යම් වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලී අනුපාතයේ (EIR) අනුකලන කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. ඵලදායී පොලී අනුපාතය (EIR) ක්‍රමක්ෂය කිරීම - ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට ඇතුළත් කර ඇත.

2. **ණය සහ අයවිය යුතු මුදල්**

ණය සහ අයවිය යුතු මුදල් - ක්‍රියාකාරී වෙළඳපොලේ ගෙනහැර නොදක්වන ස්ථාවර හෝ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ඇගයීමෙන් පසුව එවැනි මූල්‍ය වත්කම් තදනන්තර ලෙස මනිනු ලබන්නේ ඵලදායී පොලී අනුපාත ක්‍රමය (EIR), අත්පත් කරගැනීම මත අඩු වාරික සහ ඵලදායී පොලී අනුපාතයේ (EIR) අනුකලන කොටසන් වන ගාස්තු සහ පිරිවැය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ය. ඵලදායී පොලී අනුපාතයේ (EIR) ක්‍රමක්ෂය කිරීම මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලැබේ. අපහායනය කිරීම හේතුකොට ගෙන හටගන්නා පාඩුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ.

අයවිය යුතු මුදල් සාමූහික ලෙස අපහායනය කිරීම සඳහා සමාගම විසින් තක්සේරු කර ඇති අතර සමහර තනි තනිව සුවිශේෂී අයවිය යුතු මුදල් අපහායනය කිරීම සඳහා ප්‍රතිපාදන අවශ්‍ය නොවන බවට තීරණය කර ඇත. එයට හේතුව වන්නේ අයවිය යුතු මුදල් - අනුරූප ගෙවිය යුතු මුදලක් මගින් ආධාර කරගනු ලබන අතර අයකර ගත නොහැකි සිදුවන අවස්ථාවක එය හිලව්

කිරීමේ අවස්ථාව ඇත. මෙයින් අදහස් කරන්නේ අපහායනය කිරීම සඳහා යම් අයකිරීමක් අවශ්‍ය කරමින් අයකර ගත නොහැකි අනාවරණය කිරීමක් නොමැති බව ය.

තවද අයවිය යුතු මුදල් ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි කිරීමට අපේක්ෂිත අයිතමවලට සහ වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයට පසුව මාස දොළහක් (12) තුළ වන අතර එසේ හෙයින් ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කරනු ලැබේ. මාස 12 කට පසුව උපලබ්ධි කිරීමට අපේක්ෂිත ශේෂයන් ජංගම නොවන වත්කම් ලෙස වර්ග කරනු ලැබේ.

මූල්‍ය බැරකම්

(අ) මූලික හඳුනා ගැනීම සහ ඇගයීම

LKAS-39 හි විෂයපථය තුළ මූල්‍ය බැරකම් - ලාභ හෝ පාඩු තුළින් ණය සහ ණයට ගැනීම් හෝ උචිත පරිදි ව්‍යුත්පන්න ලෙස සාධාරණ අගය මත මූල්‍ය බැරකම් ලෙස වර්ග කරනු ලබන අතර මූලික හඳුනා ගැනීමේදී එහි මූල්‍ය බැරකමේ වර්ගීකරණය තීරණය කරනු ලැබේ.

සියලුම මූල්‍ය බැරකම් - සාධාරණ තක්සේරු කිරීමේදී සහ, ණය සහ ණයට ගැනීම්වලදී සෘජුවම ආරෝපණය කළ හැකි වැඩිපුර ගනුදෙනු පිරිවැය මත මූලික වශයෙන් හඳුනාගනු ලැබේ.

මූල්‍ය බැරකම්වලට වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු මුදල්, බැංකු අයිරා ණය සහ ණයට ගැනීම් ඇතුළත් වේ.

(ආ) තදනන්තර ඇගයීම (Subsequent Measurement)
ණය සහ ණයට ගැනීම්

මූලික හඳුනා ගැනීමෙන් පසුව ණය සහ ණයට ගැනීම් සඳහා පවතින පොලී - ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැය මත දෙවනුව ප්‍රමාණය කරනු ලැබේ. ලාභ සහ පාඩු - බැරකම් හඳුනා නොගෙන ඇති විටෙක මෙන්ම ඵලදායී පොලී අනුපාත ක්‍රමයේ (effective interest rate method) ක්‍රමක්ෂය ක්‍රියාපටිපාටිය තුළින් ආදායම් ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ.

3.8 සේවක ප්‍රතිලාභ

3.8.1 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂික

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මකි.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මට අදාලව ශේෂ පත්‍රයේ හඳුනාගනු ලබන බැරකම පවතින්නේ සේවකයෙකු විශ්‍රාම ගැන්වීමේදී ඔහුට ලබාදීමට අවශ්‍ය කරනු ලබන මූල්‍ය බැඳීම් සැපයීම සඳහා පාරිතෝෂික පනතේ දැක්වෙන ප්‍රතිපාදන පදනම් කරගෙන ය. කෙසේ වෙතත් එකී සැපයීම ආරම්භ වන්නේ සේවයට බැඳී පළමු වර්ෂය සම්පූර්ණ කිරීමෙනි. ප්‍රතිලාභ සැලැස්මට අභ්‍යන්තරිකව මුදල් සපයනු ලබන අතර අවශ්‍ය වූ විටෙක එකී බැඳීම් සපුරාලීම පිණිස අවශ්‍ය අරමුදල් සමාගම විසින් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර ඇත.

LKAS-19 හි 60 වෙනි ඡේදයෙන් සපයා ඇති පරිදි ඇස්තමේන්තු සහ සංඛ්‍යාත්මක කෙටි මාර්ග ප්‍රමිතියේ වෙන්කර ඇති විස්තරාත්මක ගණනය කිරීම්වල සාධාරණ ආසන්න කිරීමක් ලබාදෙයි.

(අ) නිශ්චිත දායක සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලසේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලබන සියලුම සේවකයින් අනුපිළිවෙල ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව අදාල දායක අරමුදල්වලින් ආවරණය වේ. දායක සැලස්ම - විස්තීර්ණ ආදයම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

3.8.2 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය බැරකම්

වර්ථාකරන දිනය වන විට යම් වගකීමක් හේතු කොටගෙන සම්පත් ගලාමක් සිදුවන බවද, ඒ පිළිබඳ විස්වාසදායක ඇස්තමේන්තුවක් කලහැකි බව ද නිශ්චිත නම් එම වගකීම් සඳහා ප්‍රථිපාදන වෙන් කිරීමක් සිදුකරනු ලැබේ.

සම්පත්වල පිටත ගලා යාම (outflow) දුරස්ථ නම් මිසක සියලුම අසම්භාවී බැඳීම් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහනක් ලෙස අනාවරණය ලැබේ.

ආර්ථික ප්‍රථිලාභ ගලාඒම (inflow) නිශ්චිත වන අවස්ථාවල අසම්භාවී වත්කම් අනාවරණය කරනු ලැබේ.

3.9 ආදායම් ප්‍රකාශනය

3.9.1 ආදායම් හඳුනා ගැනීම

සමාගම වෙත ආර්ථික ප්‍රතිලාභ කෙතරම් නිශ්චිත ලෙස ගලනු ලැබේද යන්න මත ආදායම හඳුනාගනු ලබන අතර ආදයම සහ දරනු ලබන හෝ දැරිය යුතු ආශ්‍රිත පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැක. ආදායම ලබන හෝ ලැබිය යුතු මුදලේ සාධාරණ අගය මත මනිනු ලබන අතර එය මාන්‍ය පරිදි ගිණුම්ගත කරනු ලබන්නේ උපචිත පදනම මත ය. ආදායම හඳුනා ගැනීම පිණිස පහත සඳහන් විශේෂ උපමානයන් භාවිතා කරනු ලැබේ.

(අ) සේවා සැපයීම

සේවා සැපයීමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ සේවා සපයනු ලබන ගිණුම් කාලපරිශේදය තුළ ය.

(ආ) පොලී ආදායම

පොලී ආදයම - තැන්පත් කරනු ලබන දින සිට වාර්තා කරනු ලබන දිනට උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

3.9.2 ලං.වි.බ. මණ්ඩලය සහ සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම අතර ඇතිකර ගනු ලැබූ ගිවිසුමට අනුව 2017 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි ගැනුම්කරුවෙකුගේ සහ විකුණුම්කරුවෙකුගේ ආදායම හඳුනා ගැනීමේ ක්‍රමය වෙනස් කරන ලදි. ගල් අඟුරු - ජැටිය දක්වා සැපයීම මත භාණ්ඩ සඳහා අයිතිය ලබාදුන් බවට සලකනු ලබන අතර ඒ අනුව ගැණුම්කරු වෙත ඉන්වොයිසිය නිකුත් කරනු ලැබේ. මෙම ප්‍රතිපත්තිය ගැණුම්කරු (ලං.වි.ම) විසින් උපයෝගී කරගනු ලබන ප්‍රතිපත්තිය සමග ගැලපේ.

කෙසේ වෙතත් අප විසින් වැට් බදු කලින් එකතු කරන නිසා වැට් බදු ලැබුණු දිනය පදනම් කරගෙන වැට් බදු වාර්තා සම්පූර්ණ කරනු ලැබේ. වැට් බදු සඳහා ඉන්වොයිසියක් සහ එකිනෙකට වෙනස් කාර්තු දෙකක් තුළ ආදායම හඳුනා ගැනීමේ හැකියාව ඇත. මෙම ක්‍රියාවලියේ ස්ථීර බව පවත්වා ගැනීම පිණිස 2016 වර්ෂය සඳහා සාපෙක්ෂ සංඛ්‍යාද නව ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලව වෙනස් කරනු ලැබී ය.

ඒ අනුව සියලුම ගල් අඟුරු සැපයුම් - කර්මාන්තශාලාවේ ජැටිය දක්වා ගෙන ගොස් සැපයීම දක්වා දැරිය යුතු මුළු පිරිවැය මත මිළ කරනු ලැබේ. වෙනත් වචනයෙන් සඳහන් කරන්නේ නම් ගල් අඟුරු මෙ.ටො. එකක් සඳහා මිළ පිහිටුවනු ලබන්නේ සම සෘජු පිරිවැය (par with direct costs) මත ය. ඊට අමතරව ශුද්ධ පොදුකාර්ය පිරිවැය සඳහා ද ඉන්වොයිස් ඉදිරිපත් කරනු ලබයි.

3.10 වියදම් හඳුනා ගැනීම

ව්‍යාපාර කරගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්ත්වයක් තුළ දේපළ, පිරියත සහ උපකරණ පවත්වාගෙන යාමේදී දැරීමට සිදුවන සියලුම වියදම් - වර්ෂය වෙනුවෙන් ලාභ සඳහා ළඟාවීමේදී ආදායමට අයකර ඇත. ව්‍යාපාරය කරගෙන යාමේ හෝ ව්‍යාපාරයේ ඉපයීම් ධාරිතාවය වැඩිකිරීමේ කාර්යය වෙනුවෙන් අදහස් කරගෙන වත්කම්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

අත්පත් කරගැනීමේ හෝ, ස්ථීර ස්වභාවයේ වත්කම් විස්තීර්ණ කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය පිණිස දැරීමට සිදුවන සියලූම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය පිණිස සමාගමේ කාර්යසාධනයේ මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම පදනම් කරගෙන වියදම්වල ක්‍රියාකාරීත්වය (function of expenses) නමැති ක්‍රමය උපයෝගී කරගෙන ඇත.

3.11 මුල්‍ය පිරිවැය

සියලූම පොලී අඩංගු මුල්‍ය පිරිවැය සහ ණය ගැනීම් සම්බන්ධයෙන් දැරීමට සිදුවන අනිකුත් පිරිවැය - ඒවා ප්‍රාග්ධනීකරණය වූ අවස්ථාවේදී යෝග්‍යතා වත්කම් සම්බන්ධයෙන් දැරීමට සිදුවන වියදම් හැර ඒවා දරනු ලබන කාලපරිච්ඡේදය තුළ දරනු ලබන පිරිවැය ලෙස හඳුනාගනු ලැබේ.

3.12 කොටස් එකක් සඳහා ඉපයීම්

ලංකා විදුලිබල මණ්ඩලය සමග අත්සන් කරන ලද නව ගිවිසුමට අනුව කොටස් එකක් සඳහා ඉපයීම් (EPS) ගණනය කරනු නොලැබේ. අයකරගනු ලබන මිල - ශුද්ධ පොදුකාර්ය පිරිවැයට සමාන වනු ඇත.

3.13 ආදායම් බදු වියදම්

ආදායම් බදු වියදම් වර්තමාන බදුවල අඩංගු වේ. ආදායම් බදු වියදම් - වය සම කොටස්වලදී හඳුනාගනු ලබන අවස්ථාවේදී සමකොටස්වල සෘජුවම හඳුනාගනු ලබන අයිතමයට අදාල වන ප්‍රමාණයට හැර ලාභ හෝ පාඩුවලදී හඳුනාගනු ලැබේ.

සෘජුව සහ වක්‍රව පිරිවැය සමානව මිළ ආකෘතිය උපයෝගී කරගැනීමේ සිට බදුවලින් වන බලපෑම වැදගත් නොවන අතර එසේ හෙයින් විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැත.

3.14 වර්තමාන බදු

වර්තමාන බදු යනු වාර්තා කරනු ලබන දිනට පනවා ඇති බදු අනුපාත භාවිතා කරමින් සහ පෙර වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු බදුවලට සිදුකරනු ලබන යම් ගැලපීමක් සැළකිල්ලට ගනිමින් වර්ෂය සඳහා බදු ගෙවිය යුතු ආදායම මත අපේක්ෂිත ගෙවිය යුතු බදු වේ.

මුල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි, 2006 අංක 10 දරණ දේශීය ආදායම් බදු පනතේ දැක්වෙන ප්‍රතිපාදනවලට අනුකූලව සහ පසු කාලීනව එකී පනතට ගෙන එන ලද සංශෝධන ප්‍රකාරව අදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් කරගනු ලබන්නේ ආදායම් සහ වියදම්වල මූලිකාංග ය.

3.15 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඇත්තේ 'වක්‍ර ක්‍රමය' (indirect method) භාවිතා කරමිනි. ගෙවන ලද පොලී මුදල් - මෙහෙයුම් මුදල් ප්‍රවාහ ලෙසද ගෙවන ලද ලාභාංශ - මුල්‍ය මුදල් ප්‍රවාහ ලෙසද වර්ග කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය පිණිස පොලී සහ ලැබුණු ලාභාංශ - ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය පිණිස මුදල් සහ මුදල් සමාන අයිතම - බැංකුවේ සහ අත ඇති මුදල්, කෙටි කාලීන තැන්පතු සහ හිගව පවතින බැංකු අයිරාවලින් සමන්විත වේ.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2017	2016
		රු.	රු.
(04)	ආදායම්		
	පිරිවැටුම	31,909,923,832	27,532,178,190
	ලං.වි.ම. විසින් ප්‍රතිපූරණය කිරීම්	43,330,417	44,058,134
		31,953,254,249	27,576,236,324
04.1	ශුද්ධ පොදු කාර්ය පිරිවැය ගණනය කිරීම		
	පරිපාලන වියදම්	(50,042,674)	(51,219,994)
	මූල්‍ය පිරිවැය	(74,385)	(68,050)
	ලියාපදිංචි කිරීමේ ආදායම්	4,871,357	6,577,904
	මූල්‍ය ආදායම්	1,915,285	652,006
	කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ පොදු කාර්ය (මාස 12)	(43,330,417)	(44,058,134)
(05)	විකුණුම් පිරිවැය		
	නැව් තෙක් නොමිලේ (FOB) වටිනාකම	27,029,294,659	22,423,090,367
	නැව් කුලිය	3,852,978,969	3,823,826,109
	බත්තල් ගාස්තු	917,712,229	1,150,218,116
	නාවික සහ අනිකුත් ගාස්තු	109,937,975	135,043,598
		31,909,923,832	27,532,178,190
(06)	අනිකුත් ආදායම්		
	ලියාපදිංචි කිරීමේ ආදායම්	4,871,357	6,577,904
		4,871,357	6,577,904
(07)	මූල්‍ය ආදායම්		
	පොලී ආදායම්	1,915,285	652,006
		1,915,285	652,006
(08)	බදුවලට පෙර ලාභය		
	බදුවලට පෙර ලාභය සඳහන් කරනු ලබන්නේ පහත සඳහන් වියදම්ද ඇතුළුව සියලුම වියදම් අයකර ගැනීමෙන් පසුව ය :		
	කාර්යමණ්ඩලය සඳහා වැටුප්	14,240,709	13,230,077
	සේවක අර්ථසාධක අරමුදල	1,988,919	2,010,862
	සේවා නියුක්තයින්ගේ භාර අරමුදල	497,230	502,716
	විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන	593,070	429,136
	අධ්‍යක්ෂ ගාස්තු	490,000	470,000
	ක්ෂය කිරීම්	1,201,925	1,361,024
	විගණන ගාස්තු	-	-
		19,011,853	18,003,815
	වර්ෂය තුළ තිබෙන කොටස් ගණන	2,000,000	2,000,000

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(09) දේපළ, පිරියත සහ උපකරණ

පිරිවැය	2017.01.01 දිනට ශේෂය රු.	එකතු කිරීම් රු.	අපහරණය/ මාරු කිරීම් රු.	2017.12.31 දිනට ශේෂය රු.
ගෘහ භාණ්ඩ සහ උපකරණ	1,213,726	734,110		1,947,836
පරිගණක	1,960,400	1,312,017		3,272,417
උපකරණ	1,636,610	313,980		1,950,590
බද්දට ගත් ඉඩම් වැඩිදියුණු කිරීම	1,514,582	-		1,514,582
ජාල පද්ධතිය	86,925	-		86,925
මෝටර් රථ	6,261,816	-		6,261,816
ජෙනරේටරය	845,000	-		845,000
කන්ටේනර් නවාතැන්	6,744,085	-	-	6,744,085
	20,263,144	**2,360,106**	-	**22,623,250**

ක්ෂය කිරීම්	2017.01.01 දිනට ශේෂය රු.	එකතු කිරීම් රු.	අපහරණය/ මාරු කිරීම් රු.	2017.12.31 දිනට ශේෂය රු.
ගෘහ භාණ්ඩ සහ උපකරණ	787,665	124,044		911,709
පරිගණක	1,440,551	320,030		1,760,582
උපකරණ	753,994	276,587		1,030,581
බද්දට ගත් ඉඩම් වැඩිදියුණු කිරීම	1,354,416	160,166		1,514,582
ජාල පද්ධතිය	68,586	18,340		86,925
මෝටර් රථ	6,010,058	133,758		6,143,816
ජෙනරේටරය	52,813	169,000		221,813
කන්ටේනර් නවාතැන්	6,744,085	-		6,744,085
	17,212,168	**1,201,925**	-	**18,414,092**

ශුද්ධ පොත් අගයන්	2016.12.31 දිනට ශේෂය රු.			2017.12.31 දිනට ශේෂය රු.
ගෘහ භාණ්ඩ සහ උපකරණ	426,061			1,036,126
පරිගණක	519,849			1,511,835
උපකරණ	882,616			920,009
බද්දට ගත් ඉඩම් වැඩිදියුණු කිරීම	160,166			-
ජාල පද්ධතිය	18,340			-
මෝටර් රථ	251,757			118,000
ජෙනරේටරය	792,188			623,188
කන්ටේනර් නවාතැන්	-			-
මුළු ධාරණ වටිනාකම	**3,050,976**			**4,209,157**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2017	2016
		රු.	රු.
(10)	අනිකුත් ජංගම නොවන වත්කම්		
	ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ්	236,785,640	236,785,640
	සීමාසහිත ලංකා නැව් සංස්ථාව (ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් - CSCL (TISCL) - සටහන	539,192,079	539,192,079
		775,977,718	**775,977,718**

* මෙය සීමාසහිත ලංකා නැව් සංස්ථාව ලවා ගල් අඟුරු සැපයීම වෙනුවෙන් (ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් අයවිය යුතු මුදල වේ. මෙම මුදල ලැබුණු පසුව එය ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු අතර, අනුරූප ගෙවිය යුතු මුදල සටහන 19 - ණයහිමියන් හි පිළිබිඹු වේ. ගිණුම් අතර තිබෙන වෙනස, ගිවිසුම ප්‍රකාරව මිල වැඩිවීම මගින් විස්තර කර ඇත.

(11)	ණයගැතියන් සහ අනිකුත් අත්තිකාරම්		
	නැව් 154 ක් දක්වා සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් අයවිය යුතු පැරණි රක්ෂණ	50,479,875	-
	නැව් අංක 155 සිට සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් අයවිය යුතු අලුත් රක්ෂණ	7,168,263	-
	කළමනාකරණ ගාස්තු	28,505,392	-
	වරාය ප්‍රමාද ගාස්තු නිදහස් කිරීම	9,591,902	-
	කාර්යාල කුලී	1,160,250	1,287,000
	Deaf Coal Shipment සඳහා අත්තිකාරම්	-	(4,032,664)
	තාප ගල් අඟුරු නැව්බඩු තොගය සඳහා වෙළඳ ණයහිමියන් (ලං.වි.ම.)	3,106,316,264	172,861,297
	167-13 නැව සඳහා අත්තිකාරම	236,210,415	-
	168-14 නැව සඳහා අත්තිකාරම	248,169,727	-
	169-15 නැව සඳහා අත්තිකාරම	101,747,732	-
	වෙළඳ ණයහිමියන් (ලං.වි.ම.) - බොයිලේරු ගල් අඟුරු	25,920,460	(25,984,424)
	නොබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්	1,115,987	1,115,987
	විවිධ ණයගැතියන්	18,075,802	15,444,620
	ලං.වි.ම. විසින් දැරිය යුතු බදු	12,241,774	12,241,774
		3,846,703,841	**172,933,590**
(12)	ආපසු ගෙවනු ලබන තැන්පතු		
	අනිකුත් තැන්පතු		
	සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් තබන ලද තැන්පතු	70,433	70,433
		50,000	50,000
		120,433	**120,433**
(13)	මූල්‍ය වත්කම්		
	REPO හි ආයෝජනය කිරීම - මහජන බැංකුව	80,000,000	15,139,726
		80,000,000	**15,139,726**
(14)	කාර්යමණ්ඩලය සඳහා ණය		
	ආපදා ණය		
	උත්සව අත්තිකාරම්	5,039,886	1,775,370
		30,000	18,000
		5,069,886	**1,793,370**
(15)	අයවිය යුතු බදු		
	රඳවා ගැනීමේ බදු		
	අයවිය යුතු චිකතු කළ අගය මත බදු (වැට්)	77,718	77,718
	ආර්ථික සේවා ගාස්තු	26,506,919	26,506,919
		894,150	894,150
		27,478,787	**27,478,787**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2017	2016
		රු.	රු.
(16)	අත ඇති මුදල් සහ බැංකුවේ තිබෙන මුදල්		
	ගිණුම් අංක 7952807 - ලංකා බැංකුව	1,234,569	1,234,569
	ඉතිරි කිරීමේ ගිණුම් අංක 9225340 - ලංකා බැංකුව	21,414	20,575
	ජංගම ගිණුම - මහජන බැංකුව (සංස්ථාපිත ශාඛාව)	1,080,576	7,417,250
	ඉතිරි කිරීමේ ගිණුම - මහජන බැංකුව	285,950	285,950
	සුළු මුදල්	25,001	25,001
		2,647,509	**8,983,345**
(17)	රාජ්‍ය ප්‍රාග්ධන		
	සාමාන්‍ය කොටස්	20,000,000	20,000,000
		20,000,000	**20,000,000**
(18)	විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		
	වර්ෂය ආරම්භයේදී ශේෂය	1,896,920	1,467,784
	වර්ෂය සඳහා ප්‍රතිපාදන	593,070	429,136
	වර්ෂය තුළදී සිදුකරන ලද ගෙවීම්	(913,708)	-
	වර්ෂය අවසානය වනවිට ශේෂය	**1,576,282**	**1,896,920**
(19)	අනිකුත් ජංගම නොවන වගකීම්		
	ලං.වි.බ. මණ්ඩලයට ගෙවිය යුතු අත්තිකාම් (ලිබර්ටි සහ ටෝරයන්)	714,965,434	-
(20)	ණයගැතියන්		
	ගල් අඟුරු සැපයුම්කරු	2,768,415,099	-
	ලං.වි.ම. වියදම් අත්තිකාරම්	483,215,174	579,716,315
	සීමාසහිත ලංකා නැව් සංස්ථාව - 2017	369,682,620	-
	වරාය ප්‍රමාද ගාස්තු නිදහස් කිරීම - ලංකා නැව් සංස්ථාව	9,591,902	-
	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පීවිල්සී	7,168,263	-
	සීමාසහිත ලංකා නැව් සංස්ථාව - පැරණි	178,884,469	-
	SGS	1,798,491	-
	වෙළඳ ණයහිමියන්	100,083,750	284,370,106
	ගෙවිය යුතු වේතන	16,681	(53,277)
	ගෙවිය යුතු බදු	11,703,151	11,703,151
	ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (එන්බීටී)	(3,371,326)	(3,371,326)
	ගෙවිය යුතු එකතු කල අගය මත බදු (වැට්)	(12,758,801)	(12,758,801)
	විකුණුම් පිරිවැය පාලන ගිණුම	(31,781,455)	-
	විවිධ ණයගැතියන්	-	5,298,130
		3,882,648,019	**864,904,297**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2017	2016
		රු.	රු.
(21)	උපචිත වියදම්		
	විදේශ ගමන් වියදම්	1,053,180	-
	ගෙවිය යුතු සේ.අ.අ./සේ.නි.භා.අ.	405,267	283,253
	නෛතික, විගණන සහ වෘත්තීය ගාස්තු	2,000,000	-
	පාවිච්චි නොකරන ලද අසනීප නිවාඩු සඳහා ගෙවීම්	1,117,642	1,146,094
	වැටුප් - විධායක	-	375
	වැටුප් - අනිකුත් කාර්යමණ්ඩල	-	3,062
	ප්‍රසාද දීමනා	2,419,778	986,451
	වෙනත්	20,869	256,633
		7,016,737	**2,675,868**

(22)	ගෙවිය යුතු ආදයම් බදු		
	වර්ෂය ආරම්භයේදී ශේෂය	65,474,540	65,474,540
	වර්ෂය සඳහා ප්‍රතිපාදන	-	-
	වර්ෂය තුළ කරන ලද ගෙවීම්	-	-
	WHT ට එරෙහිව හිලව් කිරීම	-	-
	වර්ෂය අවසානයේදී ශේෂය	**65,474,540**	**65,474,540**

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල බදු සපයා නොමැත

(22) පොරොන්දු සහ සම්භාව්‍යතා

පහත දෙන ලද හේතු නිසා සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් නිකුත් කරන ලද ඉන්වොයිසිවල සම්පූර්ණ හෝ කොටසක් සඳහා සමාගමේ පොත්වල වෙන්කිරීම් සිදුකර නොමැත.

වියදමේ ස්වභාවය	ශ්‍රී ලංකා රු.	හේතුව
(1) ගැල් කුලී ගාස්තු	1,911,970	පාළු නැව් කුලී ගාස්තු - සැපයුම්කරුගේ තහවුරු කිරීම බලාපොරොත්තුව සිටින ලදී
	3,934,730	Freight of Deaf Coal (නැව් අංක 01) - තහවුරු කිරීම බලාපොරොත්තුව සිටින ලදී
(2) බත්තල් ගාස්තු	54,286,219	IR දේශීය ආදායම් විසින් 0% ලෙස නියම කරන ලද බත්තල් ගාස්තු සඳහා වැට් බද්ද
(3) ඉන්ධන සැපයීමේ ගැලපුම් ගාස්තු	2,569,505	මෙ.ටො./11 ට නියම කරන ලද Base Bunker මිල එහෙත් ලංකා ගල් අඟුරු සංස්ථාව විසින් මෙ.ටො./10.75 ට ගනු ලැබීය (ගිවිසුමට අනුව)
(4) ප්‍රමාද ගාස්තු	95,421,684	සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් අවබෝධ කරගැනීමත් සමග මෙම ගාස්තු එක්රැස් කරනු ලබන අවස්ථාවේදී පියවනු ලැබේ
(5) නිශ්කාශනය කිරීම, භාණ්ඩ සැපයීම සහ වියපැහැදම් කිරීම	32,764,050	මතභේදයට තුඩුදුන් නැව් බඩු තොගය සඳහා ගැල් කුලී ගාස්තු - නැව් අංක 19 (ටෝරියන්)
	8,536,720	ප්‍රමාණයට වඩා පටවන ලද භාණ්ඩ සඳහා වරාය ප්‍රමාද ගාස්තු
	1,528,890	ප්‍රමාණයට වඩා අයකරන ලද ගැල් කුලී ගැලපීම සහ වෙනත්
	200,953,767	

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(24) වාර්තා කරන දිනට පසුව ප්‍රදානය කරනු ලබන සිද්ධීන්

වාර්තා කරන දිනට පසුව මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට හෝ එහි අනාවරණය කිරීමට වැදගත් සිද්ධීන් හටගෙන නොතිබුණි.

(25) නෛතික නඩුකරවල සාරාංශය

නඩු අංකය	පෙත්සම්කරු	වගඋත්තරකරු	ආරම්භයේදී Carrying amount Dr/ (Cr)- රු.	රඅවසානයේදී Carrying amount Dr/ (Cr)- රු.
එස්සී/එච්සී/එල්ඒ35/ 2016	සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම	ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ්	236,785,640	236,785,640
සීඒඑසී/159/2016/එම්ආර්	සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම	ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ්	236,785,640	236,785,640
බේරුම්කිරීම	සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම	ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ්	236,785,640	236,785,640
එස්සීඒආර්/349/16	සුහාෂ් ජයවර්ධන මහතා	සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම	නැත	නැත

(26) සම්බන්ධිත සමාගම් සමග ගනුදෙනු

සමාගමේ නම	සම්බන්ධතාව	ගනුදෙනුව	2017 රු.	2016 රු.
ලං.වි.ම.	පරිපාලන සමාගම	වියදම් ප්‍රතිපූරණය කිරීම	මි. 43.33	මි. 44
සීමාසහිත ලංකා නැව් සංස්ථාව	කොටස්කරු	නැව් කුලී ගාස්තු	මි. 3,852.98	මි. 3823
සීමාසහිත ලංකා නැව් සංස්ථාව	කොටස්කරු	බත්තල් ගාස්තු	මි. 917.71	මි. 1019

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	අමතර සටහන්	2017	2016
		රු.	රු.
ආදායම්	(අ)	31,953,254,249	27,576,236,324
සෘජු වියදම් (විකුණුම් පිරිවැය)		(31,909,923,832)	(27,532,178,190)
දළ ලාභය		43,330,417	44,058,134
අනිකුත් ආදායම්	(ආ)	4,871,357	6,577,904
පරිපාලන වියදම්	(ඇ)	(50,042,674)	(51,219,994)
මෙහෙයුම් ලාභය		(1,840,900)	(583,956)
මූල්‍ය ආදායම්		1,915,285	652,006
මූල්‍ය පිරිවැය	(ඈ)	(74,385)	(68,050)
බදුවලට පෙර ලාභය	(ඉ)	-	-
අදායම් බදු වියදම - වර්ෂය තුළ ලද ලාභය		-	-

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

අමතර සටහන්	2017 රු.	2016 රු.
(අ) ආදායම්		
පිරිවැටුම	31,909,923,832	27,532,178,190
ලං.වි.ම. මගින් වියදම් ප්‍රතිපූරණය කිරීම	43,330,417	44,058,134
	31,953,254,249	27,576,236,324
(අ.1) ශුද්ධ ස්ථාවර පිරිවැය ගණනය කිරීම		
පරිපාලන වියදම්	(50,042,674)	(51,219,994)
මූල්‍ය වියදම්	(74,385)	(68,050)
ලියාපදිංචි කිරීමේ ආදායම්	4,871,357	6,577,904
මූල්‍ය ආදායම්	1,915,285	652,006
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ පොදු කාර්ය පිරිවැය	(43,330,417)	(44,058,134)
(ආ) ලියාපදිංචි කිරීමේ ආදායම්		
ලියාපදිංචි කිරීමේ ආදායම්	4,871,357	6,577,904
	4,871,357	6,577,904
(ඇ) පාරිපාලන වියදම්		
අධ්‍යක්ෂ ගාස්තු	490,000	470,000
කළමනාකාර අධ්‍යක්ෂගේ වැටුප	2,141,412	3,472,560
වැටුප් - විධායක	9,427,945	10,115,306
වැටුප් - අනිකුත් කාර්යමණ්ඩල	4,812,765	3,114,771
අතිකාල	1,897,822	1,763,881
නිවාඩු වෙනුවට වැටුප්	136,458	73,034
ප්‍රසාද දීමනා	2,491,226	1,028,074
පාවිච්චි නොකරන ලද අසනීප නිවාඩු සඳහා ගෙවීම	1,117,642	1,146,094
සේවක අර්ථසාධක අරමුදල	1,988,919	2,010,862
සේවානියුක්තයින්ගේ භාර අරමුදල	497,230	502,716
කාර්යමණ්ඩලයේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය	1,144,193	1,014,176
කාර්යමණ්ඩලයට ලබාදෙන ණය සඳහා පොලී වියදම	804,107	-
සේවකයින්ගේ සුභසාධනය	461,076	580,033
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන	593,070	429,136
කාර්යාල කුලී	1,764,750	1,736,000
ව්‍යාපාරික බදු - MMC	-	20,000
විදුලිය	**509,014**	459,752

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	අමතර සටහන්	2017 රු.	2016 රු.
	ජලය	41,486	109,527
	දුරකථන	765,143	422,680
	තැපැල් සහ ජවදූත සේවා	28,045	16,633
	ග්‍රන්ථ, පුවත්පත් සහ වාර සඟරා	94,477	128,103
	ලිපිද්‍රව්‍ය	597,917	453,700
	වෙබ් අඩවිය, අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල්	182,508	138,669
	මෝටර් රථ ධාවන වියදම්	1,516,877	2,311,924
	මෝටර් රථ කුලියට ගැනීමේ වියදම්	2,251,879	4,331,001
	මෝටර් රථ අළුත්වැඩියා කිරීම්	617,325	502,736
	විවිධ අයිතම	687,356	-
	කාර්යාලීය උපකරණ අළුත්වැඩියා කිරීම්	28,618	59,153
	කාර්යමණ්ඩල ගමන් වියදම්	78,345	255,418
	විදේශ ගමන් වියදම් - කාර්යමණ්ඩලය	1,877,802	-
	වෙළඳ ප්‍රචාරණ වියදම්	-	682,018
	ටෙන්ඩර් වියදම්	4,929,087	603,740
	කාර්යාල නඩත්තු කිරීම්	982,963	661,378
	වෘත්තීය ගාස්තු	2,796,006	8,138,790
	ආරක්ෂක සේවා	635,200	636,500
	සංග්‍රහ වියදම්	359,537	54,330
	මුද්දර ගාස්තු	3,000	3,000
	ක්ෂය කිරීම්	1,201,925	1,361,024
	විගණන ගාස්තු	-	-
	රක්ෂණ	89,551	2,413,277
		50,042,674	**51,219,994**

(අ)	**මූල්‍ය ආදායම්**		
	REPO's මත පොලී	1,798,850	518,603
	ඉතිරි කිරීමේ ගිණුම් මත පොලී	838	808
	කාර්යමණ්ඩල ණය මත පොලී	115,597	132,595
		1,915,285	**652,006**

(ඉ)	**මූල්‍ය පිරිවැය**		
	බැංකු ගාස්තු	74,385	68,050
	බදු පොලී		
		74,385	**68,050**

වාර්ෂික මහා සභා රැස්වීමේ දැන්වීම

පහත සඳහන් කාර්යයන් පිණිස ලංකා කෝල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම අංක 51/3, සුරනිමල පෙදෙස, දුටුගැමුණු වීදිය, කොහුවල, දෙහිවල ලිපිනයේ පිහිටා ඇති සමාගමේ ලියාපදිංචි කාර්යාලයේදී 2018 දෙසැම්බර් මස 19 වෙනි (බදාදා) දින ප.ව. 3.00 ට පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගමේ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකගේ වාර්තාව සමග ඒ පිළිබඳ ගිණුම් ප්‍රකාශනය භාර ගැනීමට සහ සමාලෝචනය කිරීමට.

2. ව්‍යවස්ථාවේ 19 වෙනි සංශෝධනයේ 154 වෙනි වගන්තියට අනුකූලව මූල්‍ය වර්ෂය සහතික කිරීම සඳහා විගණක වශයෙන් විගණකාධිපති පත් කිරීමට.

3. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සහ ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේ දිනය දක්වා පරිත්‍යාග තීරණය කිරීමට අධ්‍යක්ෂකවරුන්ට බලය පැවරීමට.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි
ලංකා කෝල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යෂක/ ලේකම්වරු

2018 දෙසැම්බර් 05 වෙනි දින
කොළඹ

සටහන් :

1. රැස්වීමට සහභාගිවීමට සහ ඡන්දය දීමට හිමිකම් කියන කොටස්කරුවෙකු ඔහු/ඇය වෙනුවෙන් සහභාගිවීමට සහ ඡන්දය දීමට පෙරකලාසියක් පත්කිරීමට ඔහුට/ඇයට හිමිකම ඇත.
2. පෙරකලාසි දරන්නෙකු සමාගමේ කොටස්කරුවෙකුවීම අවශ්‍ය නොවේ.
3. මෙම කාර්යය සඳහා පෙරකලාසි ආකෘති පත්‍රය මෙහි ඇතුළත් කර ඇත.
4. සම්පූර්ණ කරන ලද පෙරකලාසි ආකෘති පත්‍රය, රැස්වීමට සහභාගිවීම සඳහා පත්කරනු ලබන වේලාවට අඩු ගණනේ පැය විසිහතරකට (24) නොඅඩු කාලයකට පෙර අංක 51/3, සුරනිමල පෙදෙස, දුටුගැමුණු වීදිය, කොහුවල, දෙහිවල යන ලිපිනයේ පිහිටි සමාගමේ ලියාපදිංචි කාර්යාලය වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

පෙරකලාසි ආකෘති පත්‍රය

ලංකා කෝල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ කොටස්කරුවෙකු/කොටසකරුවන් වශයෙන් .... ලිපිනයේ පදිංචි ..... වන මම/අපි ..... පදිංචි ..... මයා/මිය/මෙනවිය 2018 දෙසැම්බර් මස 19 වෙනි (බදාදා) දින ප.ව. 3.00 ට පැවැත්වීමට නියමිත සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී, යම් කල් තැබීමකදී සහ ඉහත කී රැස්වීමට ආනුෂංගිකව ඒ පිළිබඳ පැවැත්වෙන සෑම ඡන්ද විමසීමකදීම මම/අපි නියෝජනය කිරීමට, මම/අපි වෙනුවෙන් කතා කිරීමට මාගේ/අපගේ පෙරකලාසි දරන්නෙකු ලෙස පත් කරමි/කරමු (හෝ ඔහුට සහභාගිවීමට නොහැකිකමෆ).

එස්.සි. ලක්සුමනගේ මහතා	හෝ ඔහුට සහභාගිවීමට නොහැකිකම *
ඒ. හේවාවිතාරන මහතා	හෝ ඔහුට සහභාගිවීමට නොහැකිකම *
එන්.පි.ඒ.ආර්. ජයවර්ධන මහතා	හෝ ඔහුට සහභාගිවීමට නොහැකිකම *
ඒ.කේ. සමරසිංහ මහතා	හෝ ඔහුට සහභාගිවීමට නොහැකිකම *
ඩී. තිලකසේන මිය	හෝ ඇයට සහභාගිවීමට නොහැකිකම *
එස්.එස්.ඩී.එන්. ධර්මප්‍රිය මහතා	හෝ ඔහුට සහභාගිවීමට නොහැකිකම *
එම්.සී.එන්. රහමාතුල්ලා මහතා	

පහත අත්සන් කරන අපි මාගේ/අපගේ පෙරකලාසි දරන්නා මම/අපි සඳහා සහ වෙනුවෙන් කතා කිරීමට පහත දක්වා ඇති මනාපයට පරිදි ඊට අනුකූලව මෙයින් බලය දෙමි/දෙමු.

	එකඟ වෙමි/වෙමු	විරුද්ධ වෙමි/වෙමු
1. ව්‍යවස්ථාවේ 19 වෙනි සංශෝධනයේ 154 වෙනි වගන්තියට අනුකූලව මූල්‍ය වර්ෂය සහතික කිරීම සඳහා විගණක වශයෙන් විගණකාධිපති පත් කිරීමට.		
2. සමාගමේ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකගේ වාර්තාව සමඟ ඒ පිළිබඳ ගිණුම් ප්‍රකාශනය භාර ගැනීමට සහ සමාලෝචනය කිරීමට.		

ඊට සාක්ෂි පිණිස වර්ෂ දෙදහස් දහඅටක් වූ ..... මස ..... වෙනි දින මම/අපි අත්සන් කළෙමි/කළෙමු.

.....

කොටස්කරුගේ/කොටස්කරුවන්ගේ අත්සන/අත්සන්

සටහන්: 1. පෙරකලාසි දරන්නෙකු සමාගමේ කොටස්කරුවෙකුවීම අවශ්‍ය නොවේ.

2. සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් අනෙක් පිටුවේ ඇත.

පෙරකලාසි ආකෘති පත්‍රය

1. ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය සහ අදාල අනිකුත් තොරතුරු පැහැදිලිව කියවිය හැකි සේ සඳහන් කරමින් සපයා ඇති ඉඩ ප්‍රමාණයේ අත්සන් කොට අත්සන් කරනු ලබන දිනයද සඳහන් කරමින් පෙරකලාසි ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමට කාරුණික වන්න.

2. සම්පූර්ණ කරන ලද පෙරකලාසි ආකෘති පත්‍රය, රැස්වීමට සහභාගිවීම සඳහා පත්කරනු ලබන වේලාවට අඩු ගණනේ පැය විසිහතරකට (24) නොඅඩු කාලයකට පෙර අංක 51/3, සුරනිමල පෙදෙස, දුටුගැමුණු වීදිය, කොහුවල, දෙහිවල යන ලිපිනයේ පිහිටි සමාගමේ ලියාපදිංචි කාර්යාලය ලැබෙන්නට සැලැස්විය යුතු ය.

3. සභාපති හෝ සමාගමේ අධ්‍යක්ෂක හැර ඔබගේ පෙරකලාසිය දරන්නා වශයෙන් පුද්ගලයෙකු පත්කිරීමට ඔබ අපේක්ෂා කරන්නේ නම්, කරුණාකර අදාල විස්තර පෙරකලාසි ආකෘති පත්‍රයේ සපයා ඇති ඉඩ ප්‍රමාණයේ (අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්වලට ඉහලින්) ඇතුළත් කරන්න.

4. පෙරකලාසි ආකෘති පත්‍රය නීතිඥවරෙයකු විසින් අත්සන් කරනු ලබන්නේ නම්, ලියාපදිංචි කිරීමේ කාර්යය පිණිස පෙරකලාසි ආකෘති පත්‍රය සමඟ අදාල ඇටෝර්නි බලකරය (එකී ඇටෝර්නි බලකරය මේ වනවිටත් සමාගමේ ලියාපදිංචි කර නොමැති නම්) ඉදිරිපත් කළ යුතු ය.

5. පත්කරන්නා සමාගමක් / සංස්ථාපිත ආයතනයක් නම්, මෙම ආකෘති පත්‍රය සමාගම් ව්‍යවස්ථාවට / ආඥාපනතට අනුකූලව ක්‍රියාවේ යෙදවිය යුතු ය.



LANKACOAL
COMPANY(PVT)LTD

Lanka Coal Company (Pvt) Ltd.
No. 51/3, Dutugemunu Street, Dehiwala, Sri Lanka.
Tel: +94 112 824 681 / +94 112 824 682
Fax: +94 112 824 689
Email: info@lankacoal.lk
Web: www.lankacoal.lk